# පුරවැසි අධ්‍යාපනය

# 10 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය
(2015 සිට ක්‍රියාත්මක වේ)



සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# පුරවැසි අධ්‍යාපනය

## ගුරු මාර්ගෝපදේශය
## 10 වන ශ්‍රේණිය

**(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**


**සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව**
**වෙබ් අඩවිය : www.nie.lk**
**විද්‍යුත් තැපෑල: info@nie.lk**

පුරවැසි අධ්‍යාපනය
10 වන ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2014

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN ..............

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිතව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හයවන සහ දහවන ශ්‍රේණි සඳහා හඳුන්වාදීම කළ යුතුව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනාවන් ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලුම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූලව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එකම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනාදී අංශයන් සඳහා අවශ්‍යවන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන්ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එමනිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමීව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම තුළින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලුම සම්පත්දායකයින් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවයෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රම වේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයෙහි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙ හි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාට ද දෙගුරුනට ද භාවිත කළ හැකිය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් පෙළ පොත හා ගුරු මාර්ගෝපදේශය යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

## උපදේශකත්වය හා අනුමැතිය

**ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය**

## සම්බන්ධීකරණය

| | |
|---|---|
| ඒ.එල්.එස්. අබේවික්‍රම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |

## ලේඛක මණ්ඩලය (බාහිර)

| | |
|---|---|
| සී.එස් ජයසිංහ | ගුරු මධ්‍යස්ථාන කළමනාකරු (විශ්‍රාමික)<br>හොරණ |
| කේ.ඒ.එන්. පුෂ්පකුමාර | ගුරු සේවය<br>පොලේගොඩ ම.වි, මහගම |
| පී.ඩී. සෝමාවතී | ගුරු උපදේශිකා (විශ්‍රාමික)<br>බුලත්සිංහල |
| පී.පී. මාලිකා | ගුරු උපදේශිකා<br>හම්බන්තොට |
| එම්.කේ කිංස්ලි ප්‍රියන්ත | කථිකාචාර්ය<br>රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, වලහන්දුව, ගාල්ල |
| එම්.එච්.එම්. යාකුත් | ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය |

## ලේඛක මණ්ඩලය (අභ්‍යන්තර)

| | |
|---|---|
| ඒ.එල්.එස්. අබේවික්‍රම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| එස්.යූ.අයි.කේ ද සිල්වා | කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| එස්. කරුණාකරන් | කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |

## විෂය විශේෂඥ සහය

| | |
|---|---|
| ආචාර්ය ශාමින්ද වනසිංහ | කථිකාචාර්ය<br>අධ්‍යාපන පීඨය<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ |
| නීතිඥ වසන්තා සෙනෙවිරත්න | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |
| නීතිඥ මෙලනි පලිහක්කාර | සම්බන්ධීකරණ නිලධාරි<br>මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය<br>නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |

## භාෂා සංස්කරණය

| | |
|---|---|
| එච්.පී. සුසිල් සිරිසේන | කථිකාචාර්ය<br>හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය<br>මීරිගම |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

2007 වර්ෂයේ සිට 10 -11 ශ්‍රේණි සඳහා ක්‍රියාත්මක වූ පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය විෂය 2015 වර්ෂයේ සිට පුරවැසි අධ්‍යාපනය නමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. ඒ අනුව 6 - 9 ශ්‍රේණි දක්වා පුරවැසි අධ්‍යාපනය විෂය අනිවාර්ය විෂයක් ලෙසත්, 10 - 11 ශ්‍රේණි සඳහා පළමුවන විෂය කාණ්ඩයේ තෝරාගත හැකි විෂයක් ලෙසත් ක්‍රියාත්මක වේ. 10 -11 ශ්‍රේණි සඳහා මෙම විෂයය ඉගැන්වීමට සතියකට කාල පරිච්ඡේද තුනක් වෙන් කර ඇත. අ.පො.ස. (සා.පෙළ) විභාගයට 10 - 11 ශ්‍රේණි සඳහා නියමිත විෂය නිර්දේශ පදනම් කරගෙන ඇගයීම් සිදු කිරීමට යෝජිතය.

පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පහසු කර ගැනීම සඳහා ගුරු අත්පොතට ඇතුළත් කර ඇති විෂය අන්තර්ගතය ආවරණය වන පරිදි ඔබගේ නිර්මාණශීලී හැකියාවන් ප්‍රයෝජනයට ගනිමින් පංති කාමර අවශ්‍යතාව අනුව ක්‍රියාකාරකම් සංවර්ධනය කර ප්‍රයෝජනයට ගැනීමට ඔබට නිදහස ඇත. මෙහි දී 2007 වර්ෂයේ නිකුත් කරන ලද 10 වන ශ්‍රේණියේ පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජාපාලනය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ද භාවිත කළ හැකි ය.

පුරවැසි අධ්‍යාපනය විෂයයෙන් සිසුන් තුළ ප්‍රගුණ කිරීමට අපේක්ෂිත නිපුණතා සංවර්ධනය කිරීමේ දී විෂය කරුණු මෙන් ම විෂය කරුණු අධ්‍යයනය කිරීමට යොදා ගන්නා ක්‍රමවේදයන් ද වැදගත් වේ. මේ සම්බන්ධයෙන් ගුරු කාර්යභාරය පහසුකර ගැනීමට අවශ්‍ය පරිදි පෙළ පොත භාවිතයට ගැනීම ද අත්‍යවශ්‍ය වේ.

10 වන ශ්‍රේණියට අදාළ මෙම පුරවැසි අධ්‍යාපනය ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීමේ දී එක් එක් නිපුණතාවට, නිපුණතා මට්ටමට අදාළ ව ඉදිරිපත් කර ඇති ඉගෙනුම් පල සාක්ෂාත් කරගත හැකි පරිදි ඉගෙනුම් ක්‍රියාවලිය සිදු කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය පාඩම් සැලසුම් සකස් කිරීමේ දී ආවරණය කළ යුතු විෂය කරුණු අවශ්‍ය උදාහරණ සහිත ව දක්වා ඇත. ගුරු අත්පොත භාවිතයට ගැනීමේ දී එක් එක් මාතෘකාවට සමගාමී ව පෙළ පොතෙහි ඇතුළත් කර ඇති කරුණු හා ක්‍රියාකරකම් ද සැළකිල්ලට ගෙන කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙහි ඇතුළත් කර ඇති ගුණාත්මක යෙදවුම් උදාහරණ වන අතර අවශ්‍ය පරිදි ඒවා වෙනස් කර ගැනීමේ නිදහස තිබේ.

පුරවැසි අධ්‍යාපනය විෂයයේ අරමුණු ඉටු වන පරිදි අවම වශයෙන් 50% ක් වත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අවස්ථා සම්පාදනය කරමින් නියමිත විෂය කරුණු අධ්‍යයනයට සිසුන් යොමු කරනු ඇතැයි අපේක්ෂා කරමු. මෙම ගුරු මාර්ගෝපදේශය සම්බන්ධ සංවර්ධනාත්මක යෝජනා වෙතොත් අප වෙත යොමු කරන මෙන් ද කාරුණික ව ඉල්ලා සිටිමු.

ව්‍යාපෘති කමිටුව

# පටුන


| | | පිටුව |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්හිමිගේ පණිවිඩය | | iv |
| විෂයමාලා කමිටුව | | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | | vi |
| විෂය නිර්දේශය අන්තර්ගතය | | viii-xxvi |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | | 1-42 |
| 10.1 | ප්‍රජාතන්ත්‍රවාදී පාලනය | 2-11 |
| 10.2 | බලය විමධ්‍යගතකරණය හා බලය බෙදා හැරීම | 12-20 |
| 10.3 | බහුසංස්කෘතික සමාජය | 21-28 |
| 10.4 | ආර්ථික ක්‍රම හා ආර්ථික සබඳතා | 29-36 |
| 10.5 | ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් නිරාකරණය | 37-42 |
| විවිධ සහාය | | 43 |


-

# පුරවැසි අධ්‍යාපනය

## විෂය නිර්දේශය

## 10 ශ්‍රේණිය

**(2015 සිට ක්‍රියාත්මක වේ)**

# හැඳින්වීම

1999 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා අනුව 2000 වර්ෂයේ සිට 7,8,9 ශ්‍රේණි සඳහා ජීවන නිපුණතා විෂයය ප්‍රථම වරට විෂයමාලාවට හඳුන්වා දෙන ලදී.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාවේ යෝජනා අනුව 2005 වර්ෂයේ සිට ඉතිහාසය හා සමාජ අධ්‍යයනය විෂයය වෙනුවට 6-11 ශ්‍රේණි සඳහා පුරවැසි අධ්‍යාපනය, භූගෝල විද්‍යාව හා ඉතිහාසය යන විෂයයන් හඳුන්වා දෙනු ලැබීය. ඒ වන විට ජීවන නිපුණතා විෂයය ද 7-9 ශ්‍රේණිවල ක්‍රියාත්මක විය.

2007 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂයය කොටස් ඒකාබද්ධ කර 6-9 ශ්‍රේණි සඳහා ක්‍රියාත්මක විය. 10-11 ශ්‍රේණි සඳහා පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය නමින් විෂයයේ නම වෙනස් කරන ලදී.

මේ අනුව 6-9 ශ්‍රේණිවල දී I කොටස ලෙස ජීවන නිපුණතා විෂයය ද II කොටස ලෙස පුරවැසි අධ්‍යාපනය විෂයය ද ක්‍රියාත්මක විය.

මෙසේ ක්‍රියාත්මක වීමේ දී ඇති වූ ප්‍රායෝගික ගැටලු හා ඒ වන විට කර තිබූ පර්යේෂණ අනාවරණ, ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්ගේ අදහස් ආදිය ද සලකා විෂය කොටස් දෙකක් වෙනුවට තනි විෂයයක් ලෙස ක්‍රියාත්මක කිරීම වඩාත් ඵලදායි බව හැඟෙන්නට විය.

6-9 ශ්‍රේණි සඳහා මෙම විෂයය කොටස් දෙකක් ලෙස ක්‍රියාත්මක වීම වෙනුවට විෂයය කොටස් දෙකේ අන්තර්ගතයේ සමානකම් සැලකිල්ලට ගෙන එක් විෂයයක් ලෙස ඒකාබද්ධ කර ක්‍රියාත්මක කිරීම වඩාත් යෝග්‍ය බැවින් විෂය නිර්දේශ නවීකරණය කිරීමේ දී එක් විෂයයක් ලෙස ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි විෂය නිර්දේශය නැවත සකස් කරන ලදී.

මේ අනුව ජීවන නිපුණතා කොටසේ තිබූ විෂය කොටස්, අවශ්‍යතාව සලකා වඩාත් යෝග්‍ය පරිදි පුරවැසි අධ්‍යාපනය විෂය කොටස සමග ඒකාබද්ධ කරන ලදී

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I	මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

I	වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැගි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III	මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV	පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V	සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI	පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII	ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII	ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත

(i) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

iv. තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම

(ii) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(iii) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා
පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා
සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා
ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබා දීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

# පුරවැසි අධ්‍යාපනය 6-11 ශ්‍රේණි විෂය අරමුණු

01. තම හැකියා දක්ෂතා විභව්‍යතා හඳුනා ගනිමින් අනාගත ජීවන ඉලක්ක ගොඩනගා ගැනීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම

02. මනා පෞරුෂයකින් යුතු ව සමාජයේ ජීවත් වීමට අවශ්‍ය නිපුණතා වර්ධනය කිරීම

03. සමාජයේ යහපැවැත්මට දායක වන සමාජ සංවිධාන හා සංස්ථා සමග එකමුතු ව කටයුතු කිරීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම

04. නිරතුරු ව වෙනස්වන ලෝකයේ අනපේක්ෂිත හා ව්‍යාකුල අවස්ථාවන්ට සාර්ථක ව මුහුණදීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම

05. බහුවිධ සමාජයක් තුළ එක්සත්බවින් යුක්ත ව ජීවත් වීමට අවශ්‍ය මානව ගුණාංග හා සමාජ සාරධර්මවලින් යුක්ත පුරවැසියන් බිහි කිරීම

06. ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට හා මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තීන්ට අනුගත ව කටයුතු කරන සමාජයක් ගොඩනැගීම

07. අපදා කළමනාකරණයට සක්‍රීයව දායක වෙමින් ආපදා අවස්ථාවලින් වැළකීම හා සිදුවන හානි අවම කර ගැනීම

08. දේශපාලන සංකල්ප, ඒවායේ ප්‍රායෝගික භාවිත සහ ශ්‍රී ලංකාවේ හා ලෝකයේ පාලන රටා පිළිබඳ අවබෝධය ලබා දීම

09. විවිධ ආර්ථික න්‍යායන් හා විවිධ ආර්ථික මූලධර්ම විමර්ශනය කිරීම හා ඒවා සමාජ ජීවිතයට යෝග්‍ය පරිදි අදාළ කර ගැනීම

10. අන්‍යෝන්‍ය වශයෙන් වගකීම් හා යුතුකම් අගයන සමාජයක් ගොඩනැගීම

11. ශ්‍රී ලංකාවට තිරසර සාමයක් ළඟා කර ගැනීම

12. දැරිය හැකි ජීවන රටාවක් ගොඩනගා ගැනීම තුළින් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනයක් ඇති කිරීම

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **ප්‍රජාතන්ත්‍රවාදී පාලනය**<br><br>10.1 ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක යහපත් පුරවැසියෙකු ලෙස කටයුතු කරයි | 10.1.1 ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වභාවය හා විකාශනය විමර්ශනය කරයි. | • "ප්‍රජාතන්ත්‍රවාදය" සංකල්පය නිර්වචනය කිරීම<br>• ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ ආරම්භය හා විකාශනය<br>• සෘජු හා වක්‍ර (නියෝජන) | • "ප්‍රජාතන්ත්‍රවාදය" නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි.<br>• සෘජු ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්‍ෂණ විග්‍රහ කරයි.<br>• සෘජු හා වක්‍ර ප්‍රජාතන්තවාදය අතර දක්නට ලැබෙන වෙනස්කම් සංසන්දනය කරයි. | 04 |
| | 10.1.2 ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක ප්‍රධාන අංග ලක්ෂණ විශ්ලේෂණය කරයි. | • ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක අංග ලක්ෂණ<br>* සර්වජන ඡන්ද බලය පදනම් කරගෙන ආණ්ඩු සහ පාලකයින් තෝරා ගැනීම<br>* තරගකාරී පක්ෂ ක්‍රමය<br>* ඡන්ද කොට්ඨාස ක්‍රමය<br>* නිදහස්, සාධාරණ මැතිවරණ<br>* ආණ්ඩු පක්ෂය හා විරුද්ධ පක්ෂයක් පැවතීම<br>* සාමානාත්මතාව හා නිදහස පදනම් කොට ගෙන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාකාරකම්වලට සහභාගි වීම | • ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක දක්නට ලැබෙන අංග ලක්‍ෂණ නම් කරයි.<br>• ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක පැවැත්මට දායක වන අංග ලක්‍ෂණ ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 10.1.3 රාජ්‍ය හා ආණ්ඩුව අතර වෙනස්කම් සහ පුරවැසියා සතු පුරවැසියා කෙරෙහි වන වගකීම් සංසන්දනය කරයි | • රාජ්‍ය හා ආණ්ඩුව නිර්වචනය කිරීම.<br>• රාජ්‍යයේ සහ ආණ්ඩුවේ ප්‍රධාන අංග<br>• රාජ්‍යයේ සහ ආණ්ඩුවේ ස්වභාවය<br>* රාජ්‍යයේ ස්වභාවය<br>* ජාතික රාජ්‍යයේ ස්වභාවය<br>* ජාතික රාජ්‍යයේ ආරම්භය හා විකාශනය<br>• රාජ්‍යයේ භූමිකාව<br>* රාජ්‍යයන්හි ප්‍රධාන ස්වරූප ඒකීය/සන්ධීය රාජ්‍ය<br>* ඒකීය හා සන්ධීය රාජ්‍යවල මූලික ලක්ෂණ | • රාජ්‍ය හා ආණ්ඩුව යන සංකල්ප නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි<br>• රාජ්‍යයේ සහ ආණ්ඩුවේ ප්‍රධාන අංග ලක්ෂණ විග්‍රහ කරයි<br>• ජාතික රාජ්‍යයේ ස්වභාවය පැහැදිලි කරයි<br>• ඒකීය හා සන්ධීය රාජ්‍යවල මූලික ලක්ෂණ තුලනාත්මකව විග්‍රහ කරයි<br>• ආණ්ඩුවේ ප්‍රධාන කොටස් හා ඒවායේ ක්‍රියාකාරිත්වය පැහැදිලි කරයි | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | • ආණ්ඩුවේ ප්‍රධාන කොටස් හා ඒවායේ ක්‍රියාකාරිත්වය<br>* ව්‍යවස්ථාදායකය<br>* විධායකය<br>* අධිකරණය<br>• ආණ්ඩුවේ ස්වරූප<br>* පාර්ලිමේන්තු ක්‍රමය<br>* ජනාධිපති ක්‍රමය<br>• පුරවැසියා සතු වගකීම්<br>* රාජ්‍ය පක්ෂපාති බව<br>* පොදු දේපළ ආරක්ෂා කිරීම<br>• පුරවැසියා කෙරෙහි වන වගකීම්<br>* සමානාත්මතාව<br>* නීතියේ සාධාරණත්වය | • පාර්ලිමේන්තු හා ජනාධිපති ආණ්ඩුක්‍රම අතර පවතින වෙනස ඒවායේ මූලික ලක්ෂණ ඇසුරින් විමසා බලයි.<br>• ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පුරවැසියකු වශයෙන් තමන් සතු වගකීම් හා තමා කෙරෙහි වන වගකීම් මැනවින් වටහා ගෙන කටයුතු කිරීමේ වැදගත්කම පිළිගනිමින් අදහස් දක්වයි. | |
| | 10.1.4 ප්‍රජාතන්ත්‍රවාදයේ පරමාදර්ශ අභ්‍යන්තරීකරණය කර ගනියි | • ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට අවශ්‍ය සාධක<br>* නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම<br>* නීතියේ ආධිපත්‍යයක් පැවතීම<br>* අධිකරණයේ ස්වාධීනත්වය | • ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සාර්ථක වීමට දායක වන සාධක පැහැදිලි කරයි.<br>• සමාජයක යහපැවැත්ම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය මැදිහත්වන ආකාරය විස්තර කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | * බුද්ධිමත් ජනතාවක් සිටීම<br>* යහපත් ආර්ථීක මට්ටමක් පැවතීම<br>* නිදහස් හා අපක්ෂපාති ජනමාධ්‍ය පැවතීම<br>* ප්‍රජාතන්ත්‍රවාදී දිවිපැවැත්ම<br><br>• ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක වැදගත්කම<br>* සමාන අයිතිවාසිකම් හිමි වීම<br>* පුද්ගල හැකියා, දක්ෂතා වර්ධනයට ඉඩප්‍රස්තා ලැබීම<br>* පුරවැසියන්ට පාලනයට සහභාගිවීමට අවස්ථාව උදා වීම<br>* මානව සංවර්ධනයට ප්‍රමුඛතාව හිමි වීම<br>* සාමකාමී සමාජයක් ගොඩනැගීමට අවශ්‍ය පදනම වැටීම<br>* සමාජ සුබසාධනය | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදාහැරීම**<br>10.2 බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදාහැරීමේ සංකල්ප පිළිබඳ අවබෝධයකින් යුතු ව කටයුතු කරයි. | 10.2.1 "බලය විමධ්‍යගතකිරීම හා බලය බෙදාහැරීමේ සංකල්ප" තුලනාත්මක ව විමසා බලයි. | • බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදාහැරීමේ සංකල්ප හැඳින්වීම | • "බලය" යනු කුමක් දැ යි නිර්වචනය කරයි.<br>• බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදා හැරීම යන සංකල්ප පැහැදිලි කරයි. | 02 |
| | 10.2.2 බලය විමධ්‍යගත කිරීමේ ඒකකවල ව්‍යූහයන්, බලතල හා කාර්යයන් ගවේෂණය කරයි. | • බලය විමධ්‍යගත කිරීමේ ඒකක<br>• අදාළ ඒකකවල ව්‍යූහයන්<br>• එම ඒකකවල බලතල හා කාර්යයන්<br>• නූතන රාජ්‍යවල බලය විමධ්‍යගත කිරීමට හේතු | • බලය විමධ්‍යගත කිරීමේ ඒකක නම් කර ඒවායේ ව්‍යූහ පැහැදිලි කරයි.<br>• බලය විමධ්‍යගත කිරීමේ ඒකක සතු බලතල හා කාර්යය විස්තර කරයි.<br>• නූතන රාජ්‍යවල බලය විමධ්‍යගත කිරීමට බලපාන හේතු පැහැදිලි කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 10.2.3 බලය බෙදාහැරීමේ ඒකකවල ව්‍යුහයන්, බලතල හා කාර්යයන් ගවේෂණය කරයි. | • බලය බෙදාහැරීමේ ඒකක<br>• අදාළ ඒකකවල ව්‍යුහයන්<br>• එම ඒකකවල බලතල හා කාර්යයන්<br>• නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට හේතු<br>• ශ්‍රී ලංකාවේ බලය බෙදාහැරීමේ හා විමධ්‍යගත කිරීමේ ඉතිහාසය | • බලය බෙදා හැරීමේ ඒකක නම් කර ඒවායේ ව්‍යුහ පැහැදිලි කරයි<br>• බලය බෙදා හැරීමේ ඒකකවල බලතල හා කාර්යයන් විස්තර කරයි.<br>• නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට හේතු සාකච්ඡා කරයි.<br>• ශ්‍රී ලංකාවේ බලය බෙදා හැරීමේ හා විමධ්‍යගත කිරීමේ ඉතිහාසය පිළිබඳ විස්තර කරයි. | 05 |
| | 10.2.4 නූතන රාජ්‍යවල ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීමේ අවශ්‍යතාව අගය කරයි. | • තෝරාගත් රටවල ව්‍යුහාත්මක වෙනස්කම් උදාහරණ * ඇමෙරිකා එක්සත් ජනපදය * ස්විට්ස්ර්ලන්තය | • ඇමෙරිකා එක්සත් ජනපදයේ බලය බෙදාහැරීමට හේතු සාකච්ඡා කරයි.<br>• ස්විට්සර්ලන්තයේ බලය බෙදාහැරීමට හේතු පැහැදිලි කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **බහුසංස්කෘතික සමාජය**<br><br>10.3 බහුසංස්කෘතික සමාජයක් තුළ සාමකාමී ව යහපත් පුරවැසියෙකු ලෙස ජීවත් වෙයි. | 10.3.1 බහුසංස්කෘතික සමාජයේ ස්වභාවය විමර්ශනය කරයි. | • " බහුසංස්කෘතික සමාජය " සංකල්පය හැඳින්වීම හා එහි මූලික ලක්ෂණ | • බහුසංස්කෘතික සමාජය යන්න පැහැදිලි කරයි.<br>• බහුසංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ විස්තර කරයි. | 03 |
| | 10.3.2 බහුසංස්කෘතික ජන සමාජයක් ඇතිවීම කෙරෙහි බලපාන හේතු ගවේෂණය කරයි. | • බහුසංස්කෘතික සමාජයක් ඇතිවීම කෙරෙහි බලපාන සාධක<br>* පිහිටීම<br>* සංක්‍රමණ<br>* ආක්‍රමණ<br>* විවිධ ජාතීන් වෙළෙඳාම සඳහා පැමිණීම<br>* ශ්‍රමිකයන් ගෙන්වා ගැනීම | • බහුසංස්කෘතික සමාජයක් ඇතිවීම කෙරෙහි බලපාන සාධක විස්තර කරයි.<br>• වර්තමාන ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික සමාජයක් ඇති වීමට වෙළඳාම හා ශ්‍රමිකයින් ගෙන්වා ගැනීම බලපා ඇති අකාරය පැහැදිලි කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 10.3.3 බහුසංස්කෘතික ජන සමාජයක පැවැත්ම සඳහා යහපාලනයක වැදගත්කම විමර්ශනය කරයි. | • යහපාලනය හැඳින්වීම<br>• යහපාලනයක ගුණාංග<br>• යහපාලනයක් සඳහා එකිනෙකාගේ දේශපාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතික අනන්‍යතාවට ගරු කිරීමේ වැදගත්කම<br>• බහුසංස්කෘතික ජන සමාජයක පැවැත්ම සඳහා යහපාලනයක වැදගත්කම | • යහපාලනය අර්ථ දක්වයි<br>• යහපාලනයක ගුණාංග සාකච්ඡා කරයි.<br>• එකිනෙකාගේ දේශපාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතික අනන්‍යතාවට ගරු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• බහුසංස්කෘතික ජන සමාජයක පැවැත්ම යහපාලනයක් තුළින් තහවුරු වන ආකාරය පැහැදිලි කරයි. | 04 |
| | 10.3.4 බහුසංස්කෘතික ජන සමාජයක ජීවත්වීමේ වැදගත්කම පැහැදිලි කරයි. | • බහුසංස්කෘතික සමාජය හා නූතන රාජ්‍ය<br>• බහුසංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග<br>* එකිනෙකාට ගරු කිරීම<br>* අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම<br>* ඉවසීම<br>* පරිත්‍යාගශීලි බව හා සහජීවනය<br>* අන්මත ඉවසීම<br>* වෙනත් භාෂා ඉගෙන ගැනීම<br>* සමානාත්මතාව<br>• බහුසංස්කෘතික ජන සමාජයේ සාමාජිකයන් ලෙස එක්සත් ව ජීවත්වීමේ ජාතික වැදගත්කම | • නූතන රාජ්‍ය බහුතරයක බහු සංස්කෘතික සමාජ ලක්ෂණ පවතින බව පැහැදිලි කරයි.<br>• බහුසංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග පැහැදිලි කරයි.<br>• බහුසංස්කෘතික සමාජයක සාමාජිකයෙක් ලෙස එක්සත්ව ජීවත්වීමේ ජාතික වැදගත්කම අගය කරමින් අදහස් ප්‍රකාශ කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **ආර්ථික ක්‍රම හා ආර්ථික සබඳතා**<br><br>10.4 ශ්‍රී ලංකාව මුහුණ දෙන ආර්ථික ගැටලු පිළිබඳ ව විශේෂ අවධානය යොමු කරමින් ආර්ථික කටයුතුවල නිරත වෙයි. | 10.4.1 මූලික ආර්ථික ප්‍රශ්න හා ආර්ථික ක්‍රියාකාරකම් විමර්ශනය කරයි. | • " අර්ථ ක්‍රමය " නිර්වචනය කිරීම හා හැඳින්වීම<br>• ඕනෑ ම ආර්ථිකයක් මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න හඳුනා ගැනීම<br>• නිෂ්පාදන සාධක හා ඒවාට කරන ගෙවීම් හැඳින්වීම<br>• ආර්ථිකයක සිදු වන ක්‍රියාවලි හැඳින්වීම | • අර්ථ ක්‍රමය නිර්වචනය කරයි.<br>• ආර්ථිකයක් මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න පැහැදිලි කරයි.<br>• නිෂ්පාදන සාධක හා ඒවාට කරන ගෙවීම් පැහැදිලි කරයි.<br>• අර්ථ ක්‍රමයකින් ඉටුවන මූලික ආර්ථික කටයුතු විස්තර කරයි. | 03 |
| | 10.4.2 විවිධ අර්ථ ක්‍රම පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි. | • විවිධ අර්ථ ක්‍රම හඳුනා ගැනීම<br>* ධනවාදී අර්ථ ක්‍රමය<br>* සමාජවාදී අර්ථ ක්‍රමය<br>* මිශ්‍ර අර්ථ ක්‍රමය | • ලෝකයේ ඇති විවිධ අර්ථ ක්‍රම නම් කරයි.<br>• විවිධ අර්ථ ක්‍රමයන්හි මූලික ලක්ෂණ විග්‍රහ කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 10.4.3 සංවර්ධනයට සාපේක්ෂ ව වෙළෙඳපොළ ආර්ථිකයේ වර්තමාන ප්‍රවණතා විශ්ලේෂණය කරයි. | • වෙළෙඳපොළ ආර්ථික සංකල්පය හා එහි විවිධ ස්වරූප හඳුනා ගැනීම<br>• වෙළෙඳපොළ ආර්ථිකයක ලක්ෂණ<br>• වෙළෙඳපොළ ආර්ථිකවල විවිධ ස්වරූප | • වෙළෙඳපොළ ආර්ථිකයක් යනු කුමක්දැයි විස්තර කරයි<br>• වෙළෙඳපොළ ආර්ථිකයක ලක්ෂණ ලැයිස්තු ගත කරයි.<br>• වෙළෙඳපොළ ආර්ථිකයන්හි විවිධ ස්වරූප පැහැදිලි කරයි<br>• වෙළෙඳපොළ ආර්ථිකයන්හි නව ප්‍රවණතා සාකච්ඡා කරයි. | 03 |
| | 10.4.4 ශ්‍රී ලංකාව කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම විශ්ලේෂණය කරයි. | • ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික ක්‍රමය හා සංවර්ධනය<br>• වර්තමාන ශ්‍රී ලංකා ආර්ථිකය හා බැඳුණු නව සංවර්ධන ප්‍රවණතා<br>• තාක්ෂණික දියුණුව සහ ගෝලීයකරණය, ලෝක ආර්ථිකය හා ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කරන බලපෑම් | • ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික ක්‍රමයේ විශේෂ ලක්ෂණ ලැයිස්තුගත කරයි.<br>• සංවර්ධනය යන සංකල්පය නිර්වචනය කරයි.<br>• වර්තමානයේ ශ්‍රී ලංකාවේ නව සංවර්ධන ප්‍රවණතා පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>• ලෝක ආර්ථිකය කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම විස්තර කරයි.<br>• ගෝලීයකරණය ශ්‍රී ලංකා ආර්ථිකයට කරන බලපෑම සාකච්ඡා කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් නිරාකරණය**<br>10.5 ගැටුම් නිරාකරණය කර ගැනීමට අවශ්‍ය නිපුණතා ප්‍රදර්ශනය කරයි. | 10.5.1 විවිධ වර්ගයේ ගැටුම් ඇතිවීමට හේතු වන සාධක සොයා බලයි. | • ගැටුම් හැඳින්වීම<br>• ගැටුම් වර්ග හා ගැටුම් ඇතිවන මූල | • ගැටුම් යනු කුමක්දැයි හඳුන්වයි.<br>• ගැටුම් වර්ග නම් කරයි.<br>• ගැටුම් ඇති වීම සඳහා බලපාන හේතු පැහැදිලි කරයි. | 05 |
| | 10.5.2 ගැටුම් නිරාකරණය සඳහා ධනාත්මක ප්‍රවේශ ගවේෂණය කරයි. | • ගැටුම් නිරාකරණය කිරීමේ විවිධ ක්‍රම<br>* සාකච්ඡා කිරීම<br>* සහමන්ත්‍රණය සහ කේවල් කිරීම<br>* මැදිහත්කරණය<br>* සමථකරණය<br>* බේරුම් කිරීම<br>* විනිසීම<br>* එකගත්වයක් ගොඩනැගීම<br>* උපදේශනය | • ගැටුම් නිරාකරණය කිරීම සඳහා විවිධ ක්‍රමවේද පැහැදිලි කරයි.<br>• ගැටුම් සාමකාමීව නිරාකරණය කර ගැනීම පුරවැසියකු සතු යුතුකමක් බව පිළිගනිමින් කරුණු දක්වයි. | 07 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 10.5.3 ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් නිරාකරණය කිරීමේ වැදගත්කම විශ්ලේෂණය කරයි | • ගැටුම් සාමකාමී ව නිරාකරණය කර ගැනීම සඳහා පුරවැසියෙකු තුළ තිබිය යුතු ගුණාංග<br>• ගැටුම් මඟහැරීමේ හා සාමකාමී ව විසඳා ගැනීමේ වාසි<br>* සියලු දෙනාගේ අයිතිවාසිකම් සුරක්ෂිත වීම<br>* සාමකාමී සමාජ ක්‍රමයක් ගොඩනැඟීම<br>* අන්‍යෝන්‍ය සහයෝගය වර්ධනය වීම<br>* සමාජයට සිදු වන හානි අවම වීම | •සාමකාමී ව ගැටුම් නිරාකරණය කර ගැනීමට පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග සාකච්ඡා කරයි.<br>• ගැටුම් මඟ හැරීම හා සාමකාමීව විසඳා ගැනීමෙන් තම ජීවිතයට සිදුවන යහපත අගය කරමින් අදහස් ප්‍රකාශ කරයි. | 03 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# 1.0 ප්‍රජාතන්ත්‍රවාදී පාලනය

ඈත අතීතයේ සිට රාජ්‍ය පාලනය කිරීම සඳහා විවිධ පාලන ක්‍රම භාවිත කර ඇත. රාජාණ්ඩු, ඒකාධිපති ආණ්ඩු, රදළ ආණ්ඩු, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ඒ අතර විය.

ප්‍රජාතන්ත්‍රවාදයේ අර්ථය, ආරම්භය හා විකාශනය, එවැනි පාලන ක්‍රමයක් තුළ දක්නට ලැබෙන ලක්ෂණ, ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අංග, රාජ්‍යයේ සහ ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අධ්‍යයනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

පාලන ක්‍රමයක් මෙන් ම ජීවන ක්‍රමයක් ලෙස ද ප්‍රජාතන්ත්‍රවාදය වැදගත් වන බැවින් ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවකට අනුගත වීම සඳහා අවශ්‍ය නිපුණතා ශිෂ්‍යයා තුළ වර්ධනය කිරීම ද වැදගත් වේ. මේ අනුව ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශ ගරු කරන සාමාජිකයන් පිරිසක් සමාජයට දායාද කිරීමේ අවශ්‍යතාව කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

මෙහි ඇතුළත් විෂය කරුණු අර්ථාන්විත ව හා ප්‍රායෝගික ව අධ්‍යයනය කිරීමට අවස්ථාව ලබා දෙමින් ඒවා අභ්‍යන්තරීකරණය කර ගැනීමට ශිෂ්‍යයාට ඉඩ ප්‍රස්තා ලබා දීමට යෝග්‍ය පරිදි ඉගෙනුම් ඉගැන්වීම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය හැසිරවීම ඉතා වැදගත් වේ.

**10.1 නිපුණතාව**

- ප්‍රජතන්ත්‍රවාදී ජන සමාජයක යහපත් පුරවැසියකු ලෙස කටයුතු කරයි.

**නිපුණතා මට්ටම**

10.1.1 ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වභාවය හා විකාශනය විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 04**

**ඉගෙනුම් පල**

- "ප්‍රජාතන්ත්‍රවාදය" නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි.
- ඍජු ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණ විග්‍රහ කරයි.
- ඍජු හා වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය අතර දක්නට ලැබෙන වෙනස්කම් සංසන්දනය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

"ප්‍රජාතන්ත්‍රවාදය" සංකල්පය නිර්වචනය කිරීම

**ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන** (පෙළ පොතෙහි සඳහන් නිර්වචන ඇසුරින්)

දේශපාලන විද්‍යාඥයින් විසින් ප්‍රජාතන්ත්‍රවාදය නැමති සංකල්පය දෙයාකාර දෘෂ්ටිකෝණයකින් විස්තර කර ඇත.

(1) පාලන ක්‍රමයක් ලෙස

(2) සමාජ හා ජීවන දර්ශනයක් ලෙස

**ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ආරම්භය හා විකාශනය**

ප්‍රජාතන්ත්‍රවාදය ඍජු හා වක්‍ර (නියෝජන) යනුවෙන් දෙයාකාර ස්වරූපයකින් ක්‍රියාත්මක වීම මෙහි දී පැහැදිලි කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ඉදිරිපත් වී ඇති නිර්වචන, ඍජු හා වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ව සාකච්ඡා කිරීම සඳහා හැකි නම් සම්පත් පුද්ගලයින් මේ සඳහා යොදා ගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සරල නිර්වචන ඉදිරිපත් කිරීමට හා ප්‍රජාතන්ත්‍රවාදය ජීවන ක්‍රමයක් හා සමාජ ක්‍රමයක් වන බව පැහැදිලි කිරීමට අවස්ථාව සලසා ඒ ඔස්සේ සුදුසු නිර්ණායක පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

10.1.2 ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක ප්‍රධාන අංග ලක්ෂණ විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:** 08

**ඉගෙනුම් පල**

- ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක දක්නට ලැබෙන අංග ලක්ෂණ නම් කරයි.
- ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක පැවැත්මට දායක වන අංග ලක්ෂණ ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

**ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක අංග ලක්ෂණ**

උදාහරණ - සර්වජන ඡන්ද බලය පදනම් කරගෙන ආණ්ඩු සහ පාලකයන් තෝරා ගැනීම
- තරගකාරී පක්ෂ ක්‍රමය
- ඡන්ද කොට්ඨාස ක්‍රමය
- නිදහස් හා සාධාරණ මැතිවරණ
- ආණ්ඩු පක්ෂයක් හා විරුද්ධ පක්ෂයක් පැවතීම
- සමානාත්මතාව හා නිදහස පදනම් කරගෙන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාකාරකම්වලට සහභාගි වීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම
- මාධ්‍ය නිදහස හා තොරතුරු ලබා ගැනීමේ අයිතිය
- අධිකරණයේ ස්වාධීනත්වය
- නීතියේ ආධිපත්‍යය සහ නීතිය ඉදිරියේ සමානාත්මතාව

**සර්වජන ඡන්ද බලය පදනම් කරගෙන ආණ්ඩු සහ පාලකයන් තෝරා ගැනීම**

උදාහරණ – නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටක මහජන නියෝජිතයන් මඟින් පාලනය සිදු වේ.
– නියෝජිතයන් තෝරා පත් කර ගනු ලබන්නේ සර්වජන ඡන්ද බලය පදනම් කරගෙන ය.
– නියම කරන ලද වයස් සීමාවක් ඉක්ම වූ සැමට වර්ගය, කුලය, ජාතිය, වර්ණය, වෘත්තිය, ස්ත්‍රී පුරුෂ භේද ආදිය නොසලකා ඡන්ද බලය හිමි වේ.
– සර්වජන ඡන්ද බලය සමානාත්මතාව මත පදනම් වී ඇත.
– ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය යටතේ ජනතා පරමාධිපත්‍යය සර්වජන ඡන්ද බලය මඟින් සැබෑ ලෙස ක්‍රියාවට නැංවේ.

**තරගකාරී පක්ෂ ක්‍රමය**

**තරගකාරී පක්ෂ ක්‍රමයක් පැවතීම නිසා සිදුවන වාසි**

උදාහරණ • බහුවිධතාව තුළින් එක්සත් බව ගොඩනැගීම
- ප්‍රතිවිරුද්ධ මත නියෝජනය වීම
- බලයේ සිටින ආණ්ඩු පක්ෂයේ/පක්ෂවල අහිතකර ක්‍රියාදාමයන් සංවර්ධනාත්මක ව විවේචනය කිරීම
- හිතකර ක්‍රියාදාමයන් අගය කරමින් රජය සුමගට යොමු කිරීම
- අත්තනෝමතික පාලනයක් බිහි වීම වැළැක්වීම

**ඡන්ද කොට්ඨාස ක්‍රමය**

භූමි ප්‍රමාණය හෝ ජනගහනය පදනම් කරගෙන මැතිවරණයක් සඳහා භූමිය බෙදා වෙන් කරන ලද ඒකකය ඡන්ද කොට්ඨාසයක් බව පැහැදිලි කරන්න. සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාව මැතිවරණ කොට්ඨාසවලට බෙදා වෙන් කරන බව පැහැදිලි කරන්න.

**ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීමෙන් පහත සඳහන් වාසි සැලසේ.**

උදාහරණ – සුළු පක්ෂ හා කණ්ඩායම්වලට නියෝජනයක් ලබා ගත හැකි වීම
- සෑම ජන කොටසකගේ ම අදහස් ව්‍යවස්ථාදායකය තුළ පිළිබිඹු වීම
- ප්‍රාදේශීය වශයෙන් වැඩි නියෝජනයක් ලැබීම

**නිදහස් හා සාධාරණ මැතිවරණ**

ශ්‍රී ලාංකික ඡන්ද දායකයන්ට ඡන්ද ප්‍රකාශ කිරීමට ලැබෙන අවස්ථා කිහිපයක්

උදාහරණ – ජනාධිපතිවරයෙක් තෝරා ගැනීම සඳහා පැවැත්වෙන මැතිවරණ (ජනාධිපතිවරණ)
- පාර්ලිමේන්තුව/ පළාත් සභාව/ පළාත් පාලන ආයතන සඳහා නියෝජිතයන් පත් කර ගැනීම සඳහා පැවැත්වෙන මැතිවරණ
- ජනමත විචාරණය

නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම මඟින් ඡන්දදායකයාට තම මතය නිදහසේ ප්‍රකාශ කිරීමටත්, නිවැරදි ව මහජන මතය උරගා බැලීමටත් ඉඩ සැලසේ.

**නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ**

උදාහරණ- නියමිත කාල සීමාවට මැතිවරණ පැවැත්වීම
- නියමිත සුදුසුකම් සපුරා ඇති අයට ඡන්ද අපේක්ෂකත්වය/ ඡන්දදායකත්වය ලැබීමට ඇති අයිතිය සුරක්ෂිත වීම
- ඡන්ද දායකයන්ට/ ඡන්ද අපේක්ෂකයන්ට මැතිවරණ කාර්යයන්ට නිදහසේ සම්බන්ධ වීමට ඉඩකඩ ලැබීම

**සමානාත්මතාව හා නිදහස පදනම් කරගෙන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාකාරකම්වලට සහභාගි වීම**

ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක නිදහස හා සමානාත්මතාව රැකෙන පරිදි පුද්ගලයාට ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාකාරකම්වල යෙදීමට ඉඩ ප්‍රස්තා සහතික විය යුතු ය. එවන් ක්‍රියාකාරකම් කිහිපයකට නිදසුන් පහත දැක්වේ.

- මැතිවරණ පැවැත්වීම
- ජනමාධ්‍ය භාවිතය
- අදහස් ප්‍රකාශ කිරීම
- නීතිය ඉදිරියේ සමානාත්මතාව

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම**

**ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම නිසා අත්වන වාසි**

උදාහරණ – ආණ්ඩුක්‍රම ආයතන හා පුරවැසි අයිතිවාසිකම් ආදිය පිළිබඳ පාලක, පාලිත යන දෙපක්ෂය ම දැනුවත් වීම
- ආණ්ඩුක්‍රමයක ක්‍රමවත් බව හා ස්ථාවර බවක් ඇති වීම
- පුරවැසියන්ට සිය සිතුම් පැතුම් අවශ්‍යතා ආණ්ඩුක්‍රම ආයතන මඟින් ඉටු කර ගැනීමේ හැකියාව ලැබීම

**ගුණාත්මක යෙදවුම්**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978 , ප්‍රජාත්නත්‍රවාදය පිළිබඳ ලියන ලද පත්‍රිකා, ලේඛන, උද්ධෘත, මැතිවරණ කොට්ඨාස සිතියමක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ප්‍රජාතන්ත්‍රවාදි පාලනයක අංග ලක්ෂණ, සර්ව ජන ඡන්ද බලය, තරඟකාරි පක්ෂ ක්‍රමය, ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම පිළිබඳ සිසුන් දක්වන අදහස් හා මැතිවරණ සිතියමක් සකස් කිරීමට යොමුකර ඒ පිළිබඳ දක්වන කුසලතා සැලකිල්ලට ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

10.1.3 රාජ්‍යය හා ආණ්ඩුව අතර වෙනස්කම් සහ පුරවැසියා සතු හා පුරවැසියා කෙරෙහි වන වගකීම් සංසන්දනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 16**

**ඉගෙනුම් පල**

- රාජ්‍යය හා ආණ්ඩුව යන සංකල්ප නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි.
- රාජ්‍යයේ සහ ආණ්ඩුවේ ප්‍රධාන අංග ලක්ෂණ විග්‍රහ කරයි.
- ජාතික රාජ්‍යයේ ස්වභාවය පැහැදිලි කරයි.
- ඒකීය හා සන්ධීය රාජ්‍යවල මූලික ලක්ෂණ තුලනාත්මක ව විග්‍රහ කරයි.
- ආණ්ඩුවේ ප්‍රධාන කොටස් හා ඒවායේ ක්‍රියාකාරිත්වය පැහැදිලි කරයි.
- පාර්ලිමේන්තු හා ජනාධිපති ආණ්ඩුක්‍රම අතර පවතින වෙනස ඒවායේ මූලික ලක්ෂණ ඇසුරින් විමසා බලයි.
- ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පුරවැසියකු වශයෙන් තමන් සතු වගකීම් හා තමා කෙරෙහි වන වගකීම් මැනවින් වටහා ගෙන කටයුතු කිරීමේ වැදගත්කම පිළිගනිමින් අදහස් දක්වයි

.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

**රාජ්‍යය හා ආණ්ඩුව නිර්වචනය කිරීම**

**රාජ්‍යය**

රාජ්‍ය හැඳින්වීම, නිර්වචනය කිරීම

**රාජ්‍යයේ ප්‍රධාන අංග**

නූතනයේ පිළිගන්නා පරිදි රාජ්‍යය යන පදය භාවිත කළ හැක්කේ පහත සඳහන් ලක්ෂණවලින් සමන්විත සංවිධානයකට පමණි.

- නිශ්චිත භූමිය
- නිශ්චිත ජනගහනය
- ආණ්ඩුව
- ස්වාධිපත්‍යය බලය

-

**රාජ්‍යයේ හා ආණ්ඩුවේ ස්වභාවය**

ජාතික රාජ්‍යයේ ස්වභාවය

**නූතන ජාතික රාජ්‍ය ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ**

උදාහරණ - භූමිය, ජනගහනය, ආණ්ඩුව සහ ස්වාධිපති බලය යන අංග හතර පදනම් කොට ගෙන ගොඩනැඟීම

- එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් යන සංකල්පය මත සංවිධානය වී තිබීම
- වෘත්තිමය නිලබල පැලැන්තියක් මගින් පාලන බලය ක්‍රියාවට නැංවීම
- අභ්‍යන්තර හා බාහිර කරුණු සම්බන්ධයෙන් ස්වාධිපති බලය බුක්ති විඳීම

ජාතික රාජ්‍යයේ ආරම්භය හා ගොඩනැංවීමේ ක්‍රියාවලිය

- **ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතු**

උදාහරණ - වැඩවසම් ක්‍රමය බිඳ වැටීම
- ධනවාදය ආරම්භ වීම
- ක්‍රිස්තියානි ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය
- කාර්මික විප්ලවය
- පුනරුදය
- ආගමික පදනම - ක්‍රිස්තියානි ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය මගින් ලැබීම
- දේශපාලන පදනම - බොඩැන්, මැකියාවෙලි, හොබ්ස් වැනි දේශපාලන චින්තකයන් විසින් ඉදිරිපත් කරන ලද නව අදහස්

**රාජ්‍යයේ භූමිකාව**

උදාහරණ - නීතිය හා සාමය සුරක්ෂිත කිරීම
- සමාජ අභිවෘද්ධිය ඇති කිරීම
- ආර්ථික කළමනාකරණය මෙහෙයවීම
- සමාජ සුභසාධන සේවා සැපයීම
- පොදු සේවා සැපයීමේ මූලික වගකීම දැරීම (පොදු කිරුම් මිනුම්, මුදල් නිකුත් කිරීම, ප්‍රවාහන, තැපැල් හා බෙහෙත්, පණිවිඩ සේවා හා යටිතල පහසුකම් සැපයීම)
- දීර්ඝ කාලීන ආර්ථික සංවර්ධන සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම
- ගැටුම් කළමනාකරණය (යුධ, කැරලි කෝලාහල, වාර්ගික අර්බුද ආදිය විසඳා අභ්‍යන්තර හා බාහිර ආරක්ෂාව මිනිසාට සලසා දීමට බැඳී සිටීම)
- ස්වාභාවික විපත්වලින් පීඩාවට පත් වූවන්ට සහන සැලසීම (ගංවතුර, නියඟ, සුළි සුළං, භූමිකම්පා, සුනාමි වැනි)

**රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප**

- ඒකීය
- සන්ධීය

ඒකීය රාජ්‍යයක දැකිය හැකි ලක්ෂණ දෙකක් පෙන්වා ඇත.

- මධ්‍යම ආණ්ඩුවේ උත්තරීතරභාවය
- අතිරේක ස්වාධිපති ආයතන ආණ්ඩු ක්‍රමය තුළ නොමැති වීම

**සන්ධීය රාජ්‍යය**

- සන්ධීය රාජ්‍ය ක්‍රමයක මූලික ලක්ෂණ
  - රාජ්‍ය බල අධිකාරය මධ්‍යම සහ ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදී තිබීම
  - බලය බෙදාහැර තිබීම
  - සන්ධීය රාජ්‍ය තුළ මධ්‍යම සහ ප්‍රාන්ත වශයෙන් බල මධ්‍යස්ථාන දෙකක් දැකිය හැකි වීම.

**ආණ්ඩුව හැඳින්වීම සහ නිර්වචනය**

**ආණ්ඩුව පිළිබඳ නිර්වචන**

" රාජ්‍යයේ කැමැත්ත ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නංවන්නේ ආණ්ඩුව විසිනි"

" ආණ්ඩුව යනු රාජ්‍යය නොව එහි නියෝජනය පමණක් වේ. රාජ්‍යය මගින් නියම කරනු ලබන වැඩ කොටස් හෝ කාර්යභාරය ක්‍රියාවට නැංවීම ආණ්ඩුවේ වගකීම වේ"

" රාජ්‍යයේ හෝ මහජනතාවගේ කැමැත්ත ප්‍රතිපත්තිවලට හැරවීමටත් ඒවා ක්‍රියාවට නැංවීමත් කරනු ලබන රාජ්‍යයේ ප්‍රායෝගික හස්තය ආණ්ඩුව වේ.

- **ආණ්ඩුවේ ප්‍රධාන කොටස්**

උදාහරණ - ව්‍යවස්ථාදායකය
- විධායකය
- අධිකරණය

- **ව්‍යවස්ථාදායකගේ කාර්යයන්**

උදාහරණ - නීති පැනවීම
- විධායකය පාලනය කිරීම
- මුදල් පාලනය

- **විධායකයේ කාර්යයන්**

උදාහරණ - රාජ්‍ය සේවය පාලනය කිරීම
- නියෝග හා ආඥා නිකුත් කිරීම
- ත්‍රිවිධ හමුදා හා පොලීසිය පාලනය කිරීම
- විදේශ සම්බන්ධතා පාලනය කිරීම
- රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීම හා ක්‍රියාවට නැංවීම

- **අධිකරණයේ කාර්යය**

උදාහරණ - යුක්තිය පසිඳලීම
- නීති විවරණය කිරීම
- පුරවැසි අයිතිවාසිකම්වල ආරක්ෂකයෙකු ලෙස පෙනී සිටීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආරක්ෂකයෙකු ලෙස කටයුතු කිරීම
- උපදේශන කාර්යයන්

- **ආණ්ඩුවල ස්වරූපය**

නූතන රාජ්‍යයන් තුළ ක්‍රියාත්මක වන ආණ්ඩුවල ප්‍රධාන ස්වරූප දෙකක් ලෙස ජනාධිපති හා පාර්ලිමේන්තු ක්‍රමය හඳුන්වා දිය හැකි ය.

පාර්ලිමේන්තු හා ජනාධිපති ආණ්ඩුක්‍රම අතර පවතින වෙනස හඳුනා ගැනීම සඳහා යොදා ගත හැකි ප්‍රධාන ක්‍රම දෙකකි.

1. විධායක බලය හසුරුවන ආයතනය.
2. ව්‍යවස්ථාදායකය හා විධායකය අතර පවතින සබඳතාව

- **පාර්ලිමේන්තු ක්‍රමය**

උදාහරණ - බලය හසුරුවන්නේ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයක් මගිනි.
- ව්‍යවස්ථාදායකය හා විධායකය අතර ඍජු සම්බන්ධතාවක් පවතී.
- ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත් වේ.
- විධායකය තම කටයුතු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයට සාමූහික ව වගකීමට බැඳී සිටියි.
- විධායකය බලයෙන් ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකි වේ.

- **ජනාධිපති ක්‍රමය**

උදාහරණ - විධායක බලය හසුරුවන්නේ ජනාධිපතිවරයා විසිනි
- ව්‍යවස්ථාදායකය හා විධායකය අතර ඇත්තේ දුරස්ථ සම්බන්ධතාවකි
- ව්‍යවස්ථාදායකය හා විධායකය එකිනෙකින් ස්වාධීන ව තේරී පත් වේ
- ව්‍යවස්ථාදායකය හා විධායකය අතර අන්‍යොන්‍ය රඳා පැවැත්මක් නොමැති වීම
- ව්‍යවස්ථාදායකය මඟින් විධායකය පාලනය වීමක් දක්නට නොමැති වීම

උදාහරණ:- ඇමරිකාවේ හා 1978 න් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ජනාධිපති ක්‍රමය

**පුරවැසියා සතු වගකීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වන ව්‍යවස්ථාවේ පුරවැසියන්ගේ මූලික යුතුකම් පිළිබඳව අ සිට ඊ දක්වා සඳහන් කර ඇත.

අ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීතිය ආරක්ෂා කොට අනුගමනය කිරීම ද

ආ. ජාතික අභිවෘද්ධිය වර්ධනය කිරීම හා ජාතික සමගිය පෝෂණය කිරීම ද

ඇ. තමන් විසින් තෝරාගනු ලැබූ රැකියාවෙහි හෘදය සාක්ෂියට එකඟ ව නොපිරිහෙලා වැඩ කිරීම ද

ඈ. පොදු දේපළ සුරක්ෂිත කොට ආරක්ෂා කිරීම ද පොදු දේපළ අයථා පරිදි ප්‍රයෝජනයට ගැනීමට සහ නාස්ති කිරීමට එරෙහිව ක්‍රියා කිරීම ද

ඉ. සෙසු අයගේ අයිතිවාසිකම් නන් වැදෑරුම් නිදහස ගරු කිරීම ද

ඊ. ස්වභාවධර්මය සහ ස්වාභාවික සම්පත් රැක ගැනීම ද ශ්‍රී ලංකාවාසී සෑම තැනැත්තකුගේ ම යුතුකම වන්නේ ය.

**පුරවැසියා කෙරෙහි වන වගකීම්**

- සාමය, සුරක්ෂිතභාවය හා සහයෝගිතාව වර්ධනය කිරීම
- සමානාත්මතාව
- නීතියේ සාධාරණත්වය
- විනිවිදභාවයෙන් යුතු ව කටයුතු කිරීම
- සාධාරණ සමාජ ක්‍රමයක් ඇති කිරීම

**ගුණාත්මක යෙදවුම්**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978, රාජ්‍යය, ආණ්ඩුව, ජාතික රාජ්‍ය පිළිබඳ විස්තර පත්‍රිකා හා වෙනත් සුදුසු ලිපි ලේඛන, පොත් පත්, උද්ධෘත.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

අදාළ විෂය කොටස් ආවරණය වන පරිදි විවිධ ක්‍රියාකාරකම්වල සිසුන් යොදවා ඒ ඔස්සේ ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

10.1.4 ප්‍රජාතන්ත්‍රවාදයේ පරමාදර්ශ අභ්‍යන්තරීකරණය කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02**

**ඉගෙනුම් පල**

- ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සාර්ථක වීමට දායක වන සාධක පැහැදිලි කරයි.
- සමාජයක යහපැවැත්ම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය මැදිහත්වන ආකාරය විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකසා ගන්න)

- ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට අවශ්‍ය සාධක
  - නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම
  - නීතියේ ආධිපත්‍ය පැවතීම
  - බුද්ධිමත් ජනතාවක් සිටීම
  - යහපත් ආර්ථික මට්ටමක් පැවතීම
  - නිදහස් හා අපක්ෂපාතී ජන මාධ්‍ය පැවතීම
  - ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්ම

- ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක වැදගත්කම
  උදාහරණ
    - සෑම පුරවැසියෙකුට ම ජන වර්ගය, වර්ණය, ආගම, භාෂාව වැනි භේද නොසලකා සමාන අයිතිවාසිකම් හිමි වීම
    - පුද්ගල හැකියා දක්ෂතා වර්ධනය සඳහා ඉඩකඩ සලසා තිබීම
  - පුරවැසියන්ට පාලනයට සහභාගි වීමට අවස්ථාව ලැබීම
  - සර්වජන ඡන්ද බලය මගින් පාලකයන් පත් කිරීම
  - මැතිවරණ සඳහා ඡන්ද අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් වීම
  - මානව සම්පත් සංවර්ධනයට ප්‍රමුඛතාව හිමි වීම
  - සාමකාමී සමාජයක් ගොඩනැගීම සඳහා අවශ්‍ය පදනම සකස් වී තිබීම
  - සමාජ සුභසාධනය

ඉහත කරුණු පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න

**ගුණාත්මක යෙදවුම්**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1978)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක වැදගත්කම පිළිබඳ ව බිත්ති පුවත්පතකට කෙටි ලිපියක් සකස් කිරීමට යොමු කර ඒ ඔස්සේ සිසුන් ඇගයීම සිදු කරන්න.

## 2.0 බලය විමධ්‍යගතකරණය හා බලය බෙදා හැරීම

නූතන රාජ්‍ය තුළ දක්නට ඇති බහුවිධතාව නිසා ගැටලු රාශියක් මතු ව තිබේ. ජාතික එකමුතුවක් පවත්වාගෙන යාම, ජාතික ආරක්ෂාව සහතික කිරීම, සාමය පවත්වා ගැනීම, කාර්යක්ෂම පාලනයක් ගෙන යාම, ජනතාව වැඩි වශයෙන් පාලනයට හවුල් කර ගැනීම, සංවර්ධනය වේගවත් කිරීම යනාදිය ඒ අතර ප්‍රධාන වේ. එම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අතීතයේ ද, වර්තමානයේ ද විවිධ ක්‍රමෝපා ගවේෂණයට බුද්ධිමතුන් ක්‍රියාකර ඇත. එම ක්‍රමෝපා අතුරින් බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදා හැරීම එක් ක්‍රමවේදයක් ලෙස වර්තමානයේ පිළිගෙන ඇත. මෙම ඒකකයෙන් සාකච්ඡා කිරීමට උත්සාහ ගෙන ඇත්තේ බලය විමධ්‍යගත කරණය හා බලය බෙදා හැරීම යන සංකල්ප හඳුනාගෙන රටක බලය විමධ්‍යගතකරණය හෝ බලය බෙදා හැරීම සිදු කරනු ලබන්නේ කුමන අරමුණු සපුරා ගැනීම සඳහා ද යන්න පිළිබඳවත්, රටක බලය විමධ්‍යගතකරණය හෝ බලය බෙදා හැරීම කළ යුත්තේ ඇයි ද යන්න පිළිබඳවත් සරල අවබෝධයක් ලබා දීම සඳහා ය.

**10.2 නිපුණතාව**

- බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදා හැරීමේ සංකල්ප පිළිබඳ අවබෝධයකින් යුතු ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම**

10.2.1 " බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදා හැරීමේ සංකල්ප " තුලනාත්මක ව විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02**

**ඉගෙනුම් පල**

- "බලය" යනු කුමක්දැයි නිර්වචනය කරයි.
- බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදා හැරීම යන සංකල්ප පැහැදිලි කරයි.


**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදා හැරීම යන සංකල්ප හැඳින්වීම
  - බලය හැඳින්වීම

- බලය විවිධ ස්වරූපවලින් පැවතීම
  - දේශපාලන බලය
  - පරිපාලන බලය
  - සමාජ බලය
  - ආර්ථික බලය

- බලය විමධ්‍යගත කිරීම
  - මධ්‍යම ආණ්ඩුව එහි කේන්ද්‍රීය ආයතනවල සිට සැලසුම්, සම්පත් කළමනාකරණය, සම්පත් සපයා ගැනීම හා බෙදා හැරීම පිළිබඳ වගකීම පහළ මට්ටමේ පරිපාලන ආයතනවලට, පළාත් පාලන ආයතනවලට, පළාත් ආණ්ඩුවලට, අර්ධ ස්වාධීන රාජ්‍ය අධිකාරී හෝ සංස්ථාවලට යනාදි වශයෙන් පැවරීමක් සිදු කිරීම.
  - බලය විමධ්‍යගත කිරීම සිදුකළ හැකි ආකාර
    - මධ්‍යම ආණ්ඩුවේ නිලබල ක්‍රමය විභේදනයට ලක් කිරීම (පරිපාලන කටයුතු විමධ්‍යගත කිරීම)

      උදාහරණ:- ශ්‍රී ලංකාවේ පරිපාලන බලතල ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම් කරා විමධ්‍යගත කිරීම.



- මධ්‍යම ආණ්ඩුවේ කාර්යයන් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම

  උදාහරණ:- ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පිහිටු වීම

  (මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා)

- රාජ්‍ය ව්‍යවසායකත්වයට හෝ අධිකාරියට අයත් බලතල පවරා දීම
  - මෙහි දී විවිධ රාජ්‍ය ව්‍යවසාය මෙහෙය වීම සඳහා විවිධ දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල, අධිකාරී වෙත අවශ්‍ය බලතල පවරා දීම සිදු වේ.
- ආණ්ඩුවේ පරිපාලන කාර්යයන් එක් මධ්‍යස්ථානයක් විසින් ඉටු නොකර එම කාර්යයන් මධ්‍යම රජය විසින් ගන්නා ජාතික ප්‍රතිපත්ති, සැලසුම් හා එකඟතාවන්ට අනුව ප්‍රාදේශීය ඒකක මඟින් ඉටු කිරීමට සැලැස්වීම විමධ්‍යගත කිරීම තුළින් සිදු වේ.
- ඒ අනුව මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලය ඉවතට ඇදී යාමක් විමධ්‍යගතකරණයේ දී සිදු වේ.

- බලය බෙදා හැරීම

  උදාහරණ:- ඇමෙරිකා එක්සත් ජනපදය

  කැනඩාව

  ස්විට්සර්ලන්තය

  එසේ බලය බෙදා හැරීමක් සහිත ව ක්‍රියාත්මක වන ආණ්ඩු ක්‍රමයක් සන්ධීය හෙවත් ෆෙඩරල් ( Federal ) ආණ්ඩු ක්‍රමයක් ලෙස හැඳින්වේ.

**ගුණාත්මක යෙදවුම්**

බලය විමධ්‍යගත කිරීමට හා බලය බෙදාහැරීමට අදාළ ව විස්තර සහිත ලේඛන, පත්‍රිකා, උද්ධෘත.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

සිසුන් බලය විමධ්‍යගතකරණය හා බලය බෙදා හැරීම යන සංකල්ප නිවැරදි ව අර්ථකථනය කිරීම හා සිසුන්ගේ කුසලතා පිළිබඳ සැලකිල්ලට ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

10.2.2 බලය විමධ්‍යගත කිරීමේ ඒකකවල ව්‍යුහ, බලතල හා කාර්යයන් ගවේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 05**

**ඉගෙනුම් පල**

- බලය විමධ්‍යගත කිරීමේ ඒකක නම්කර ඒවායේ ව්‍යුහ පැහැදිලි කරයි.
- බලය විමධ්‍යගත කිරීමේ ඒකක සතු බලතල හා කාර්යය විස්තර කරයි.
- නූතන රාජ්‍යවල බලය විමධ්‍යගත කිරීමට බලපාන හේතු පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගතකරණයේ දී යොදාගෙන ඇති ඒකක
    - ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම සඳහා යොදා ගෙන ඇති ප්‍රධාන ඒකක තුනකි.
    - මධ්‍යම ආණ්ඩුව
    - පළාත් සභා
    - පළාත් පාලන ආයතන

- එම ඒකකවල බලතල හා කාර්යයන්
    - මධ්‍යම ආණ්ඩුවට අයත් බලතල හා කාර්යයන්
        - මධ්‍යම ආණ්ඩුව ප්‍රධාන ආයතන 03 කින් සමන්විත වේ. එම ආයතන නම්
            - විධායකය
            - ව්‍යවස්ථාදායකය
            - අධිකරණය

- එම ආයතන තුන සතු බලතල හා කාර්යයන් පහත පරිදි දැක්විය හැකි ය.

| විධායකය සතු බලතල හා කාර්යයන් | ව්‍යවස්ථාදායකය සතු බලතල හා කාර්යයන් | අධිකරණය සතු බලතල හා කාර්යයන් |
|---|---|---|
| උදාහරණ -<br>1. රාජ්‍යයේ නායකයා වීම<br>2. ආණ්ඩුවේ නායකයා වීම<br>3. විධායකයේ නායකයා වීම<br>4. සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා වීම | උදාහරණ -<br>1. නීති පැනවීම<br>2. අයවැය සම්මත කිරීම<br>3. විධායකය පාලනය කිරීම<br>4. වැදගත් පණත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම හා සම්මත කිරීම<br>5. ජනතාවගේ දුක් ගැනවිලි සාකච්ඡා කිරීම | උදාහරණ -<br>1. නඩු විනිශ්චය කිරීම<br>2. මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම<br>3. නීති අර්ථ කථනය කිරීම<br>4. පනත් කෙටුම්පත් වල ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීම |

- නූතන රාජ්‍යවල බලය විමධ්‍යගත කිරීමට හේතු
  - මධ්‍යම ආණ්ඩුවේ පරිපාලන කටයුතු පහසු කර ගැනීම
  - මධ්‍යම ආණ්ඩුව සතු බලතල ප්‍රාදේශීය වශයෙන් පවරා දීම
    උදාහරණ:- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
  - ප්‍රාදේශීය වශයෙන් පුද්ගලයන් පාලන කටයුතුවලට සහභාගි කර ගැනීම
  - ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් කිරීම හා ජනතා අවශ්‍යතා සපුරා ලීම
  - ප්‍රාදේශීය සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම
  - ජනතාවගේ දෛනික අවශ්‍යතා පහසුවෙන් ඉටුකර ගැනීමට අවස්ථාව ලබා දීම
    උදාහරණ:- උප්පැන්න සහතික නිකුත් කිරීම
    රථවාහන ලියාපදිංචි කිරීමේ සහතික නිකුත් කිරීම

**ගුණාත්මක යෙදවුම්**

ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කර ඇති ආකාරය පෙන්වීම සඳහා සුදුසු සිතියමක් (පළාත් දැක්වෙන සිතියම) මධ්‍යම ආණ්ඩුව, පළාත් සභා, පළාත් පාලන ආයතන පිළිබඳ ලියවී ඇති විස්තර පත්‍රිකා බලතල හා කාර්යයන් බෙදා දැක්වෙන සටහනක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ක්‍රියාකාරකම්වල දී සිසුන් දක්වන ප්‍රතිචාර සැලකිල්ලට ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

10.2.3 බලය බෙදා හැරීමේ ඒකකවල ව්‍යුහයන්, බලතල හා කාර්යයන් ගවේෂණය කරයි.


**කාලච්ඡේද සංඛ්‍යාව:** 05

**ඉගෙනුම් පල**

- බලය බෙදා හැරීමේ ඒකක නම් කර ඒවායේ ව්‍යුහ පැහැදිලි කරයි.
- බලය බෙදා හැරීමේ ඒකකවල බලතල හා කාර්යයන් විස්තර කරයි.
- නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට හේතු සාකච්ඡා කරයි.
- ශ්‍රී ලංකාවේ බලය බෙදා හැරීමේ හා විමධ්‍යගත කිරීමේ ඉතිහාසය පිළිබඳ විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- **බලය බෙදා හැරීමේ ව්‍යුහ**




- සන්ධීය රාජ්‍යවල බලය බෙදා හැරීම සිදු කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.
- සන්ධීය රාජ්‍යයක එක් මධ්‍යම ආණ්ඩුවක් හා ප්‍රාන්ත ආණ්ඩු කිහිපයක් පවතී.
- සන්ධීය රාජ්‍ය විසින් බලය බෙදා හැරීම සඳහා ප්‍රධාන ක්‍රම තුනක් අනුගමනය කරයි.
  - මධ්‍යම ආණ්ඩුවේ බලතල සඳහන් කර ඉතිරි සියලු බලතල ප්‍රාන්ත ආණ්ඩුවලට පවරා දීම
  - ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල දක්වා ඉතිරි සියලු බලතල මධ්‍යම ආණ්ඩුවට පවරා දීම
  - මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල දක්වා ඉතිරි සියලු බලතල සමගාමී ලැයිස්තුවක් යටතේ එම ආයතන දෙකට ම පැවරීම
- මෙම ක්‍රම අතුරින් එක් ක්‍රමවේදයක් යොදා ගෙන සන්ධීය රාජ්‍ය තම බලය බෙදා හැරීම සිදු කරයි.

- **මධ්‍යම ආණ්ඩුව සතු බලතල**

උදාහරණ:
- ජාතික ආරක්ෂාව හා සම්බන්ධ බලතල
- විදේශ කටයුතුවලට අදාළ බලතල
- ත්‍රිවිධ හමුදාව මෙහෙයවීම
- මූල්‍ය පාලනය
- ජාතික මැතිවරණ පැවැත්වීම

- **ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල**

  උදාහරණ: - ප්‍රාන්තයට අදාළ ව මැතිවරණ පැවැත්වීම
  - ප්‍රාන්ත අධිකරණ කටයුතු
  - යටිතල පහසුකම් සංවර්ධනය
  - මහජන උපයෝගීතා සේවා පවත්වා ගෙනයාම

- **නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට හේතු**

  උදාහරණ: - විවිධ කුල, ගෝත්‍ර, වාර්ගික කණ්ඩායම්වලින් සමන්විත රාජ්‍යයක් වීම
  - ආර්ථික විෂමතා
  - භූමියේ විශාලත්වය
  - රාජ්‍ය පාලන කටයුතු සඳහා වැඩි පිරිසකට අවස්ථාව සැලසීම
  - ප්‍රාදේශීයව පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම

- **ශ්‍රී ලංකාවේ බලය බෙදා හැරීමේ හා විමධ්‍යගත කිරීමේ ඉතිහාසය**

  උදාහරණ: - ලංකාව රුහුණු, මායා, පිහිටි වශයෙන් පාලන ඒකක කිහිපයකට බෙදා තිබීම
  - අනුරාධපුර, පොළොන්නරු රාජධානි සමයන්හි දී රජු විසින් ඇපාවරු, මාපාවරු වශයෙන් ප්‍රාදේශීය පාලකයින් තෝරා පත් කිරීම
  - බටහිර ජාතීන් ශ්‍රී ලංකාවට පැමිණෙන විට උඩරට, කෝට්ටේ, යාපනය වශයෙන් ප්‍රාදේශීය රාජ්‍යයන් කිහිපයක් තිබීම

- ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම සම්බන්ධයෙන් විමසීමේ දී ඒ සඳහා ගත් උත්සාහයන්

  උදාහරණ - 1972 දිසා දේශපාලන අධිකාරී ක්‍රමය
  - 1972 අයවැය විමධ්‍යගතකිරීම
  - 1978 දිසා ඇමති ක්‍රමය
  - 1980 දිස්ත්‍රික් සංවර්ධන සභා

- ශ්‍රී ලංකාවේ බලය බෙදීමට ගත් උත්සාහයන් රාශියක් ද වේ. ඒ අනුව බලය බෙදීමට කරන ලද යෝජනා කිහිපයක් පහත දැක්වේ.
  - 1931 ඩොනමෝර් කොමිසමේ යෝජනා
  - 1952 සර් ජෝන් කොතලාවල මැතිතුමා ඉදිරිපත් කළ යෝජනා
  - 1957 බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම මගින් ඉදිරිපත් කළ රට සභා පනත
  - 1965 ඩඩ්ලි - චෙල්වනායගම් ගිවිසුම
  - 1987 පළාත් සභා ක්‍රමය ඇති කිරීම
  - 1989 ජනාධිපතිවරණයේ දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඉදිරිපත් කළ යෝජනා.
  - 1994 ගාමිණී දිසානායක මැතිතුමා ඉදිරිපත් කළ යෝජනා
  - 1997 පොදු ජන එක්සත් පෙරමුණ ඉදිරිපත් කළ යෝජනා
  - 2000 දී චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිණිය ඉදිරිපත් කළ යෝජනාවලිය

**ගුණාත්මක යෙදවුම්**

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (13 වන සංශෝධනය සහිත ව)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදා හැරීම පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡාවල දී දක්වන ප්‍රතිචාර සැලකිල්ලට ගෙන සුදුසු නිර්ණායක පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

10.2.4 නූතන රාජ්‍යවල ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීමේ අවශ්‍යතාව අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 03**

**ඉගෙනුම් පල**

- ඇමෙරිකා එක්සත් ජනපදයේ බලය බෙදා හැරීමට හේතු සාකච්ඡා කරයි
- ස්විට්සර්ලන්තයේ බලය බෙදා හැරීමට හේතු පැහැදිලි කරයි

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- තෝරාගත් රටවල ව්‍යුහාත්මක වෙනස්කම්
  උදාහරණ: ඇමෙරිකා එක්සත් ජනපදය
  ස්විට්සර්ලන්තය
- ඇමෙරිකා එක්සත් ජනපදය සන්ධීය රාජ්‍යයක් ලෙස බිහි වීමට හේතු (පෙළ පොතේ සඳහන් පාඩම ඇසුරින් පැහැදිලි කරන්න)
- ස්විට්සර්ලන්තය සන්ධීය රාජ්‍යයක් ලෙස බිහිවීමට හේතු (පෙළ පොතේ සඳහන් පාඩම ඇසුරින් පැහැදිලි කරන්න)

**ගුණාත්මක යෙදවුම්**

ඇමෙරිකා එක්සත් ජනපදය හා ස්විට්සර්ලන්තය පිළිබඳ ව විස්තර ඇතුළත් කාර්ය පත්‍රිකා, අන්තර්ජාලයෙන් ලබා ගත් අදාළ තොරතුරු, ඇමෙරිකා එක්සත් ජනපදය හා ස්විට්සර්ලන්තය පැහැදිලි ව දැක්වෙන ලෝක සිතියමක්.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ඇමෙරිකා එක්සත් ජනපදයේ හා ස්විට්සර්ලන්තයේ බලය බෙදීම පිළිබඳ ව විස්තර ඇතුළත් පොත් පිංචක් සකස් කිරීමට සිසුන්ට පවරා ඒ සඳහා නිර්ණායක මුලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

## 3.0 බහුසංස්කෘතික සමාජය

වර්තමාන සමාජය අතිශය සංකීර්ණ වූවකි. මෙම සංකීර්ණත්වයට ආර්ථික, සමාජීය, දේශපාලන, සංස්කෘතික සාධක බලපා ඇත. ඊට අමතර ව භූගෝලීය සාධක මෙන් ම සංක්‍රමණ, ආක්‍රමණ වැනි හේතූන් ද බලපා තිබේ. එම නිසා වර්තමාන සමාජය විවිධ ජන වර්ග, විවිධ භාෂා, විවිධ ආගම්, ඇදහිලි, සිරිත් විරිත්, වැනි වෙනස්කම්වලින් යුක්ත වේ. මෙවැනි විවිධතා සහිත සමාජ ක්‍රම සමාජ විද්‍යාඥයින් විසින් බහුවිධ සමාජ ලෙස අර්ථ දක්වා තිබේ. බහුවිධ සමාජයන්හි ජීවත්වන විවිධ ජන කොටස් තම අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම උදෙසා ඔවුන්ට ම විශේෂිත වූ සිරිත් විරිත්, භාෂා, ආගම්, ඇදහිලි, සිතුම් පැතුම්, සම්ප්‍රදායන්, පුරුදු පුහුණු පවත්වා ගෙන යති. මේ නිසා එක රටක වූවත් සංස්කෘතිය බහුවිධතාවකින් යුක්ත විය හැකි ය. එවැනි විවිධ සංස්කෘතීන්ගෙන් යුක්ත සමාජය "බහුසංස්කෘතික සමාජය" ලෙස හඳුන්වනු ලැබේ. මෙම ඒකකයෙන් අපේක්ෂා කරන්නේ බහුසංස්කෘතික සමාජ පිළිබඳ නිරවුල් අවබෝධයක් ලබා දීමත්, එවැනි සමාජයක අන්‍යෝන්‍ය සහයෝගයෙන් සාමකාමී ව ජීවත් වීම සඳහා අවශ්‍ය වාතාවරණයක් ගොඩ නැගීමට ඉවහල් වන්නා වූ නිපුණතාවලින් පිරිපුන් පුරවැසියන් පිරිසක් බිහි කිරීමත් ය.

**10.3 නිපුණතාව**

- බහුසංස්කෘතික සමාජයක් තුළ සාමකාමී ව යහපත් පුරවැසියකු ලෙස ජීවත් වෙයි.

**නිපුණතා මට්ටම**

10.3.1 බහුසංස්කෘතික සමාජයේ ස්වභාවය විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:** 03

**ඉගෙනුම් පල**

- බහුසංස්කෘතික සමාජය යන්න පැහැදිලි කරයි.
- බහුසංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

"බහුසංස්කෘතික සමාජය" සංකල්පය හැඳින්වීම හා එහි මූලික ලක්ෂණ


- " සමාජය" යන්න හැඳින්වීමට ඉදිරිපත් කරන ලද විවිධ නිර්වචන
  " සංස්කෘතිය " හැඳින්වීම

( මෙම ගුරු අත්පොතට ඇතුළත් කර ඇත්තේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් උදාහරණ කිහිපයකි. බහුසංස්කෘතික සමාජයක් පවතින රටවලට උදාහරණ ලෙස ඉන්දියාව, ඇමෙරිකා එක්සත් ජනපදය වැනි රටවල සංස්කෘතික විවිධත්වය පිළිබඳ ව තොරතුරු සොයා බැලීමට ද සිසුන් යොමු කරන්න)

බහුසංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ

උදාහරණ:
- විවිධ ජන වර්ග ජීවත් වීම
- විවිධ ආගම් අදහන පුද්ගලයින් සිටීම
- විවිධ භාෂා කතා කරන පුද්ගලයින් සිටීම
- විවිධ ජන වර්ග, විවිධ ආගම් හා බැඳුණු සිරිත් විරිත් හා සම්ප්‍රදායන් දක්නට ලැබීම
- ප්‍රාදේශීය වශයෙන් විවිධ වීම

බහුසංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ (ශ්‍රී ලංකාව ඇසුරින්)




- විවිධ ජනවර්ග ආගම් හා බැඳුණු විවිධ සිරිත්විරිත් හා සම්ප්‍රදායන්

  උදාහරණ:
  - බෞද්ධ සිරිත්විරිත් හා සම්ප්‍රදායන්
  - හින්දු සිරිත්විරිත් හා සම්ප්‍රදායන්
  - ඉස්ලාම් සිරිත්විරිත් හා සම්ප්‍රදායන්
  - ක්‍රිස්තියානි කතෝලික සිරිත්විරිත් හා සම්ප්‍රදායන්

- ප්‍රාදේශීය විවිධත්වය
  - උඩරට
  - පහත රට
  - රජරට

**ගුණාත්මක යෙදවුම්**

ශ්‍රී ලංකාවේ ජන සංයුතිය දැක්වෙන සංඛ්‍යා ලේඛනයක්, ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ශ්‍රී ලංකාවේ ජන සංයුතිය අනුසාරයෙන් බහුසංස්කෘතික සමාජයක් ගොඩනැගෙන ආකාරය පිළිබඳ සිසුන් දක්වන ප්‍රතිචාර ඇගයීමට ලක්කරමින් තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

10.3.2 බහුසංස්කෘතික සමාජයක් ඇති වීම කෙරෙහි බලපාන හේතු ගවේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 03**

**ඉගෙනුම් පල**

- බහුසංස්කෘතික සමාජයක් ඇති වීම කෙරෙහි බලපාන සාධක විස්තර කරයි.
- වර්තමාන ශ්‍රී ලංකාවේ බහුසංස්කෘතික සමාජයක් ඇති වීමට වෙළෙඳාම හා ශ්‍රමිකයින් ගෙන්වා ගැනීම බලපා ඇති අකාරය පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම සැලසුම් සකස් කර ගන්න)

- බහුසංස්කෘතික සමාජයක් ඇති වීම කෙරෙහි බලපාන සාධක
  - පිහිටීම
  - සංක්‍රමණ
  - ආක්‍රමණ
  - විවිධ ජාතීන් වෙළෙඳාම සඳහා පැමිණීම
  - ශ්‍රමිකයන් ගෙන්වා ගැනීම

**ගුණාත්මක යෙදවුම්**

ශ්‍රී ලංකාව පැහැදිලි ව දැක්වෙන ලෝක සිතියමක්.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

බහුසංස්කෘතික සමාජයක් ඇති වීම කෙරෙහි බලපාන සාධක පිළිබඳ ව සිසුන් සංවාදයකට යොමු කර සුදුසු නිර්ණායක පදනම් කර ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

10.3.3 බහුසංස්කෘතික ජන සමාජයක පැවැත්ම සඳහා යහපාලනයක වැදගත්කම විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 04**

**ඉගෙනුම් පල**

- යහපාලනය අර්ථ දක්වයි.
- යහපාලනයක ගුණාංග සාකච්ඡා කරයි.
- බහුසංස්කෘතික ජන සමාජයක පැවැත්ම යහපාලනයක් මඟින් තහවුරු වන ආකාරය පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- යහපාලනය හැඳින්වීම
- යහපාලනයක ගුණාංග

උදාහරණ - දූෂණයෙන්, වංචාවෙන් තොර රාජ්‍ය පාලනය හා පරිපාලනය
- නිදහස හා සාධාරණත්වය
- අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම
- අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු කිරීම
- මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම
- මනා කැපවීමෙන් යුතු ව කටයුතු කිරීම
- නීතියේ ආධිපත්‍යට ගරු කිරීම
- විනිවිදභාවයකින් යුතු ව කටයුතු කිරීම
- පුද්ගල යුතුකම් හා වගකීම් ඉටු කිරීම

- යහපාලනයක් සඳහා එකිනෙකාගේ දේශපාලන, සමාජ ආර්ථික හා සංස්කෘතික අනන්‍යතාවට ගරු කිරීමේ වැදගත්කම

උදාහරණ - එකිනෙකාගේ දේශපාලන අනන්‍යතාවට ගරු කිරීම
- එකිනෙකාගේ පෞද්ගලිකත්වයට ගරු කිරීම
- දේශපාලන නායකත්වයට ගරු කිරීම
- දේශපාලන තීන්දු හා තීරණ ගැනීමේ දී ස්වාධීන ව කටයුතු කිරීම
- එම තීරණ අන්‍යයන්ට බාධාකාරී නොවීම

- බහුසංස්කෘතික ජන සමාජයක පැවැත්ම සඳහා යහපාලනයක වැදගත්කම

උදාහරණ - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උත්තරීතර නීතිය ලෙස සැලකීම හා ඊට අනුකූල ව පාලන කටයුතු ගෙන යාම
- නීතියේ ආධිපත්‍ය ක්‍රියාත්මක වීම
- අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම
- සමානාත්මතාව සුරැකීම
- භාෂණයේ නිදහස තහවුරු කිරීම
- විනිවිදභාවයක් පැවතීම
- සහභාගිත්වයට ඇති අයිතිය පිළිගැනීම
- මූලික අයිතිවාසිකම් ගරු කිරීම හා ආරක්ෂා කිරීම
- අල්ලස් හා දූෂණවලින් තොර වීම
- ජනමාධ්‍ය නිදහස පැවතීම හා සත්‍ය තොරතුරු දැන ගැනීමට අවස්ථාව හිමිවීම
- මනා කැපවීම

**ගුණාත්මක යෙදවුම්**

සකස්කර ගනු ලබන පාඩම්වලට අදාළ ව සුදුසු ගුණාත්මක යෙදවුම් සකසා ගන්න. ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

සුදුසු නිර්ණායක පදනම් කරගෙන එක් එක් පාඩම අවසානයේ ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

10.3.4 බහුසංස්කෘතික ජන සමාජයක ජීවත්වීමේ වැදගත්කම පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 05**

**ඉගෙනුම් පල**

- නූතන රාජ්‍ය බහුතරයක බහුසංස්කෘතික සමාජ ලක්ෂණ පවතින බව පැහැදිලි කරයි.
- බහුසංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග පැහැදිලි කරයි.
- බහුසංස්කෘතික සමාජයක සාමාජිකයෙකු ලෙස එක්සත් ව ජීවත් වීමේ ජාතික වැදගත්කම අගය කරමින් අදහස් ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- බහු සංස්කෘතික සමාජය හා නූතන රාජ්‍ය
  - නූතන ව්‍යවහාරය අනුව රාජ්‍ය වශයෙන් සැලකිය හැක්කේ භූමිය, ජනගහනය, ආණ්ඩුව හා ස්වාධිපති බලය හිමි සංවිධානයකට ය.
  - නූතන බොහෝ රාජ්‍ය එක ම ජන කණ්ඩායමකින් සමන්විත නොවේ. විවිධ ජන කොටස්වලින් සමන්විත වන නිසා ඔවුන්ට ආවේණික සංස්කෘතීන් දැකිය හැකි ය. එවැනි ගති ලක්ෂණ සහිත රාජ්‍යයන් බහුසංස්කෘතික ජන සමාජ ලෙස හැඳින්විය හැකි ය.
- බහුසංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළයුතු ගුණාංග

  උදාහරණ
  - අන්‍යමත ඉවසීම හා හොඳින් ඇහුම්කන් දීම
  - අන්‍යමතවලට ගරු කිරීම
  - අන්‍ය ආගම්වලට අවමන් නොකිරීම
  - අන්‍ය සංස්කෘතීන් පිළිබඳ දැනුවත් වීම හා ඒවාට සැලකීම
  - අන්‍ය සංස්කෘතික උරුම ආරක්ෂා කිරීමට පියවර ගැනීම
  - එකිනෙකාට ගරු කිරීම
  - පරිත්‍යාගශීලී බව හා සහජීවනය වර්ධනය කර ගැනීම
  - වෙනත් භාෂා ඉගෙන ගැනීම
  - සමානාත්මතාවයෙන් කටයුතු කිරීම
- බහුසංස්කෘතික ජන සමාජයේ සාමාජිකයන් ලෙස එක්සත් ව ජීවත් වීමේ ජාතික වැදගත්කම

  උදාහරණ
  - ජාතික සමගිය, සහජීවනය වර්ධනය වීම
  - ගැටුම් අවම වීම, අන්‍යෝන්‍ය සුහදත්වය හා විශ්වාසය වර්ධනය වීම
  - එක් ජාතියක් , එක් රටක් (one nation, one country) යන හැඟීම පුරවැසියන් තුළ වර්ධනය වීම
  - මිනිස් නිදහස තහවුරු වීම හා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වීම
  - රටේ සංවර්ධනය වෙනුවෙන් සෑම පුරවැසියෙකු ම නොපිරිහෙලා වැඩ කිරීම හා එය ජාතික යුතුකමක් සේ සලකා කටයුතු කිරීමට පෙළඹීම
  - අන්‍ය ආගම් හෝ සංස්කෘතීන්ට අගරු නොවන ආකාරයට හැසිරීම

**ගුණාත්මක යෙදවුම්**

ලෝකයේ රටවල් බෙදා වෙන් කරන ලද සිතියම, ශ්‍රී ලංකාවේ පළාත් හා පරිපාලන දිස්ත්‍රික්ක වෙන් කර දක්වා ඇති සිතියම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

බහුසංස්කෘතික සමාජයක එක්සත් ව ජීවත්වීමේ වැදගත්ක ම සම්බන්ධයෙන් සිසුන් සමඟ සාකච්ඡාවක් පවත්වා සිසුන් දක්වන ප්‍රතිචාර සැලකිල්ලට ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

## 4.0 ආර්ථික ක්‍රම හා ආර්ථික සබඳතා

ආර්ථික ක්‍රම හා ආර්ථික සබඳතා පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී ලොව සෑම ආර්ථිකයක් ම සම්පත් හිඟකමට මුහුණ දෙන බව පෙනී යයි. නිෂ්පාදන ක්‍රියාවලියේ දී මෙන් ම පරිභෝජන ක්‍රියාවලියේ දී මෙම හිඟකම ගැටලුවක් ව පවතින බැවින් තාර්කික ව තීරණ ගැනීමට සිදු වේ.

සම්පත් හිඟකම මෙන් ම ආර්ථික ප්‍රශ්න ද වර්තමානයේ දී සෑම රටකට ම පොදු වූ ගැටලුවක් බවට පත්ව තිබේ. එබැවින් විවිධ රටවල් විවිධ උත්සාහයන් තුළින් මෙම ගැටලු විසඳා ගැනීමට යොමු වී ඇති බව දක්නට ලැබේ. වර්තමානයේ විවිධ ආර්ථික ක්‍රම බිහිවීමට මෙම උත්සාහයන් හේතු වී තිබේ. සමාජයේ සිදු වන වෙනස්කම් ද සමඟින් ආර්ථික ක්‍රම කාලානුරූප ව වෙනස් වීම මෙන් ම බිඳ වැටීම ද සිදු වන බව පැහැදිලි ය.

වර්තමානයේ සන්නිවේදන තාක්ෂණයේ හා විද්‍යාවේ සිදු වන ශීඝ්‍ර වෙනස් වීම තුළ සමාජ සබඳතා පුළුල් වීමක් ද දැකිය හැකි ය. මෙම ක්‍රියාවලියෙන් ලෝක ආර්ථිකයන්ට ඇති වන ධනාත්මක මෙන් ම ඍණාත්මක බලපෑම කෙරෙහි ද අවධානය යොමු විය යුතු ය. අනාගත අභියෝගයන්ට සාර්ථක ව මුහුණ දීම තුළින් තිරසර සංවර්ධනයට දායක විය හැකි සිසු පරපුරක් බිහි කිරීම සඳහා යොමු කිරීම මෙම පරිච්ඡේදයෙන් අපේක්ෂා කෙරේ.

## 10.4 නිපුණතාව

- ශ්‍රී ලංකාව මුහුණ දෙන ආර්ථික ගැටලු පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් ආර්ථික කටයුතුවල නිරත වෙයි.

**නිපුණතා මට්ටම**

10.4.1 මූලික ආර්ථික ප්‍රශ්න හා ආර්ථික ක්‍රියාකාරකම් විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:** 03

**ඉගෙනුම් පල**

- අර්ථ ක්‍රමය නිර්වචනය කරයි.
- ආර්ථිකයක් මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න පැහැදිලි කරයි.
- නිෂ්පාදන සාධක හා ඒවාට කරන ගෙවීම් පැහැදිලි කරයි.
- අර්ථ ක්‍රමයකින් ඉටු වන මූලික ආර්ථික කටයුතු විස්තර කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

"අර්ථ ක්‍රමය" නිර්වචනය හා හැඳින්වීම

- මූලික ආර්ථික ප්‍රශ්න හඳුනා ගැනීම
  1. කුමක් කොපමණ නිපදවිය යුතු ද?
  2. කෙසේ නිපදවිය යුතු ද?
  3. කවුරුන් සඳහා නිෂ්පාදනය කළ යුතු ද?
- ආර්ථිකයක සිදු වන ක්‍රියාවලිය

  ආර්ථිකයක සිදු වන මූලික කටයුතු තුනකි.

උදාහරණ – නිෂ්පාදනය
- බෙදා හැරීම
- පරිභෝජනය

- නිෂ්පාදනය
  - කෘෂි නිෂ්පාදන

    උදාහරණ:- වී, එළවළු, පළතුරු, මාළු, බිත්තර
  - කාර්මික නිෂ්පාදන

    උදාහරණ:- පොල්තෙල්, රෙදි පිළි, මෝටර් රථ
  - සේවා

    උදාහරණ:- අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහනය, තැපැල්

  නිෂ්පාදනය කරන භාණ්ඩ පහත දැක්වෙන ආකාරයට වර්ග කළ හැකි ය.

  උදාහරණ
  1. පාරිභෝගික භාණ්ඩ :- හාල්, කිරිපිටි, පරිප්පු, සීනි
  2. අන්තර් භාණ්ඩ :- ඛනිජ තෙල්, පොහොර, රසායන ද්‍රව්‍ය, රෙදි පිළි
  3. ප්‍රාග්ධන භාණ්ඩ :- යන්ත්‍ර සූත්‍ර, ප්‍රවාහන උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය

- බෙදා හැරීම

  බෙදාහැරීම තොග වෙළෙඳාම හා සිල්ලර වෙළෙඳාම වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ.

  තොග වෙළෙඳාම - නිෂ්පාදකයා හා තොග වෙළෙන්දා අතර ද තොග වෙළෙන්දා හා සිල්ලර වෙළෙන්දා අතර සිදු වේ.

  සිල්ලර වෙළෙඳාම - සිල්ලර වෙළෙන්දා හා පාරිභෝගිකයා අතර සිදු වේ.

- පරිභෝජනය

  භාණ්ඩ හා සේවා ප්‍රයෝජනයට ගනිමින් මිනිස් අවශ්‍යතා සපුරා ගැනීම පාරිභෝජනය යි

**ගුණාත්මක යෙදවුම්**

ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා, ආර්ථික විමසුම් සඟරා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

අර්ථ ක්‍රමයක සිදු වන ක්‍රියාවලිය සම්බන්ධ තොරතුරු ඇතුළත් කර බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කිරීමට යොමු කර ඒ ඔස්සේ ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**
10.4.2 විවිධ අර්ථ ක්‍රම පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 04**

**ඉගෙනුම් පල**

- ලෝකයේ ඇති විවිධ අර්ථ ක්‍රම නම් කරයි.
- විවිධ අර්ථ ක්‍රමයන්හි මූලික ලක්ෂණ විග්‍රහ කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- විවිධ අර්ථ ක්‍රම හඳුනා ගැනීම
  - ධනවාදී අර්ථ ක්‍රමය
  - සමාජවාදී අර්ථ ක්‍රමය
  - මිශ්‍ර අර්ථ ක්‍රමය

| අර්ථ ක්‍රමය | මූලික ලක්ෂණ | පවතින රටවලට නිදසුන් |
|---|---|---|
| ධනවාදී | පෞද්ගලික ව්‍යවසාය<br>පෞද්ගලික දේපළ අයිතිය<br>මිල ක්‍රමය පදනම් කරගෙන නිෂ්පාදන පිළිබඳ තීරණ ගැනීම<br>ලාභ චේතනාව | ඇමෙරිකා එක්සත් ජනපදය<br>එංගලන්තය<br>ජපානය<br>ප්‍රංශය<br>කැනඩාව |
| සමාජවාදී | පොදු දේපළ අයිතිය<br>රාජ්‍ය ව්‍යවසාය<br>මධ්‍යම සැලසුම් මණ්ඩලයක් මඟින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය පිළිබඳ තීරණ ගැනීම<br>සුභසාධන සංකල්පය | කියුබාව<br>උතුරු කොරියාව |
| මිශ්‍ර | පොදු හා පෞද්ගලික ව්‍යවසාය ක්‍රම පැවතීම<br>දේපළ අයිතිය පෞද්ගලික මෙන් ම රාජ්‍ය අයිතිය යටතේ ද පැවතීම ( ශ්‍රී ලංකාව තුළින් උදාහරණ සපයන්න) | ශ්‍රී ලංකාව<br>ඉන්දියාව<br>පකිස්තානය |

**ගුණාත්මක යෙදවුම්**
විවිධ ධනවාදි, සමාජවාදී හා මිශ්‍ර ආර්ථිකයන්ට උදාහරණ සපයන ලද රටවල් දැක්වෙන ලෝක සිතියමක්.

**ඇගයීම හා තක්සේරුකරණයට උපදෙස්**
සිසුන් එක් එක් අර්ථ ක්‍රම සම්බන්ධයෙන් දක්වන අදහස් හා ප්‍රතිචාර සැලකිල්ලට ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

10.4.3 සංවර්ධනයට සාපේක්ෂ ව වෙළඳපොළ ආර්ථිකයේ වර්තමාන ප්‍රවණතා විමර්ශනය කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව:** 03.

**ඉගෙනුම් පල**

- වෙළෙඳපොළ ආර්ථිකයක් යනු කුමක්දැයි විස්තර කරයි.
- වෙළෙඳපොළ ආර්ථිකයක ලක්ෂණ ලැයිස්තු ගත කරයි.
- වෙළෙඳපොළ ආර්ථිකයන් හි විවිධ ස්වරූප පැහැදිලි කරයි.
- වෙළෙඳපොළ ආර්ථිකයන් හි නව ප්‍රවණතා සාකච්ඡා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම සැලසුම් සකස් කර ගන්න)

- වෙළඳපොළ ආර්ථිකය හා එහි විවිධ ස්වරූප හඳුනා ගැනීම
  - වෙළෙඳපොළ ආර්ථිකය හැඳින්වීම
  - වෙළෙඳපොළ ආර්ථිකයක ලක්ෂණ

  උදාහරණ:-
    - රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලීකරණය කිරීම
    - වෙළෙඳපොළේ තත්ත්වය මත මිල තීරණය වීමට අවස්ථාව සැලසීම
    - පෞද්ගලික ආයෝජන දිරි ගැන්වීම සමගම දේශීය නිෂ්පාදනයන් සඳහා අනුබල සැපයීම
    - සහනාධාර හා මිල පාලන ක්‍රම ඉවත් කිරීම
    - රජය ආර්ථික කටයුතුවල මැදිහත් වීම සීමා විම
- වෙළෙඳපොළ ආර්ථිකවල විවිධ ස්වරූප
  - පරිවර්තන ආර්ථික
    - පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම
    - පෞද්ගලික ව්‍යවසාය දිරි ගැන්වීම
    - ආර්ථික ලිහිල්කරණය

    උදාහරණ:- චෙක් සමූහාණ්ඩුව, පෝලන්තය, රුමේනියාව, බල්ගේරියාව, හංගේරියාව
- වර්තමානයේ ක්‍රියාත්මක වන සමහර ආර්ථිකවල ද පරිවර්තන ආර්ථික ලක්ෂණ දක්නට ලැබේ.

    උදාහරණ: - චීනය
    - රුසියාව
- තවත් සමහර වෙළෙඳපොළ ආර්ථිකයන්හි ධනවාදී වෙළෙඳපොළ ලක්ෂණ වැඩි වශයෙන් ඇතුළත් ය.

    උදාහරණ:- සිංගප්පූරුව, දකුණු කොරියාව, තායිවානය, හොං කොං

**ගුණාත්මක යෙදවුම්**

එක් එක් ආර්ථික ක්‍රම සම්බන්ධයෙන් විස්තර ලියන ලද පත්‍රිකා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

වෙළෙඳපොළ ආර්ථිකයන් හි විවිධ ස්වරූප පිළිබඳ ව සිසුන් සංවාදයකට යොමු කර ඒ ඔස්සේ ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

10.4.4 ශ්‍රී ලංකාව කෙරෙහි ගෝලීකරණයේ බලපෑම විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:** 03

**ඉගෙනුම් පල**

- ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික ක්‍රමයේ විශේෂ ලක්ෂණ ලැයිස්තුගත කරයි.
- සංවර්ධනය යන සංකල්පය නිර්වචනය කරයි.
- වර්තමානයේ ශ්‍රී ලංකාවේ නව සංවර්ධන ප්‍රවණතා පිළිබඳ තොරතුරු රැස් කරයි.
- ලෝක ආර්ථිකය කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම විස්තර කරයි.
- ගෝලීයකරණය ශ්‍රී ලංකා ආර්ථිකයට කරන බලපෑම සාකච්ඡා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- සංවර්ධනය හැඳින්වීම
  - සංවර්ධනය පිළිබඳ සංකල්පය ක්ෂේත්‍ර කිහිපයක් යටතේ දැක්විය හැකි ය
    - ආර්ථික සංවර්ධනය
    - මානව හා සමාජ සංවර්ධනය
    - සංස්කෘතික සංවර්ධනය
    - තිරසර සංවර්ධනය
- වර්තමාන ශ්‍රී ලංකා ආර්ථිකය හා බැඳුණු සංවර්ධන ප්‍රවණතා
- නිදහසෙන් පසු ආර්ථිකය අවධි 5කට බෙදිය හැකි ය
  - 1948 - 1960 ද්විත්ව අර්ථ ක්‍රමයක් පැවතීම
  - 1961 - 1970 දක්වා කාලය තුළ අර්ධ විවෘත ස්වරූපයක් දක්නට ලැබුණි.
    උදාහරණ:- දැඩි විනිමය පාලනය ඉවත් කිරීම, සහනාධාර කපා හැරීම ( 1966)
  - 1970 - 1977 ආවෘත ආර්ථිකය
  - 1977 න් පසු විවෘත ආර්ථිකය
    ආනයන ආදේශන කාර්මීකරණය වෙනුවට අපනයන අභිමුඛ කාර්මීකරණය බිහි වීම
  - 2004 සිට මේ දක්වා

උදාහරණ:-
- රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම අහෝසි කිරීම
- තිරසර ආර්ථික සංවර්ධනය පවත්වා ගෙන යාමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය ( අධිවේගී මාර්ග, විදුලිබලාගාර, වරාය, ගුවන්තොටුපල)
- කෘෂි අංශය දියුණු කිරීම සඳහා පොහොර සහනාධාර ලබා දීම
- කෘෂි නිෂ්පාදන රාජ්‍ය අංශයේ මැදිහත් වීමෙන් මිල දී ගැනීම හා සහතික මිල ක්‍රමය
- දිළිඳු ජනතාව සඳහා ආර්ථික සංවර්ධන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම ( දිවි නැගුම, මග නැගුම, සමෘද්ධි සහනාධාර)
- විදේශීය ආයෝජකයන් දිරි ගැන්වීම
- ධීවර කාර්මිකයන් සඳහා ඉන්ධන සහනාධාර ලබා දීම

- ප්‍රවාහන පද්ධතිය වැඩි දියුණු කිරීම ( ලංගම බස්රථ සංඛ්‍යාව වැඩි කිරීම, දුම්රිය සංඛ්‍යාව වැඩි කිරීම, දුම්රිය මාර්ග නවීකරණය කිරීම)
- සංචාරක ආකර්ෂණය තුළින් සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට කටයුතු කිරීම ( නගර අලංකරණය, හෝටල් පහසුකම් වැඩි දියුණු කිරීම)
- ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්ය බවට පත් කිරීම සඳහා "පංචබල කේන්ද්‍රය" හඳුන්වා දීම
- උතුරු හා නැගෙනහිර පළාත් සංවර්ධනයට විශේෂ අවධානයක් යොමු කිරීම (නැගෙනහිර නවෝදය, උතුරු වසන්තය)
  (මහා බැංකු වාර්තාව ඇසුරින් සුදුසු තොරතුරු රැස්කර ගන්න)
  නව ආර්ථික සංවර්ධනයත් සමඟ ශ්‍රී ලංකාවට අත් කර ගත හැකි වූ වාසි කීපයක් ද දැකිය හැකි ය

වාසි

- සේවා නියුක්තිය ඉහළ යාම
- විදේශ විනිමය ඉපයුම් ඉහළ යාම
- ජනතාවගේ ජීවන මට්ටම් ඉහළ යාම
- ප්‍රාදේශීය සංවර්ධනය
- නිෂ්පාදනයේ ඇති වූ වර්ධනය
- ගෙවුම් ශේෂ ලේඛනයේ සේවා ගිණුමේ වර්ධනය
- තොරතුරු තාක්ෂණය යටතේ විවිධ අංශ හා බැඳුණු රැකියා වෙළෙඳපොළ පුළුල් වීම

• තාක්ෂණික දියුණුව හා ගෝලීයකරණය ලෝක ආර්ථිකය හා ශ්‍රී ලංකාව කෙරෙහි කරන බලපෑම
  - ගෝලීයකරණය හැඳින්වීම

• ගෝලීයකරණය ලෝක ආර්ථිකයට කරන බලපෑම
  - නව සහස්‍රය සමඟ ලෝක ආර්ථිකය වේගවත් වෙනස්වීම්වලට භාජනය වීම
  - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුවේ සහ ලෝක වෙළෙඳ සංවිධානය නොමඳ සහාය ලබමින් බටහිර ලෝකය ගෝලීයකරණයට නතු වීම
  - කලාපීය සංවිධාන බිහි වීම හා ඒවා මුල්කර ගෙන ජාත්‍යන්තර වෙළෙඳ කටයුතුවලට සම්බන්ධ වීම.

    උදාහරණ:- යුරෝපා සංගමය (EU) , උතුරු ඇමෙරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (North American Free Trade Agreement (NAFTA), දකුණු ආසියානු වරණාත්මක වෙළෙඳ ගිවිසුම (South Asian Peferential Trade Agreement) ( SAPTA) , බෙංගාල මුහුදු තීරය අවට රටවල් සිහිටුවා ගත් ආර්ථික සහයෝගිතා සංගමය (BIMST – EC)
    ජාත්‍යන්තර ආර්ථික කණ්ඩායම් බිහි වීම
    G – 7, G – 77, G – 24, G – 15

  - විදේශ සෘජු ආයෝජන ජාත්‍යන්තර වශයෙන් සංචලනය වීම

    උදාහරණ:- බහු ජාතික සමාගම්

  - වෙළෙඳපොළ ආධිපත්‍යය තුළින් සංවර්ධනය වෙමින් පවතින රටවලට ලැබෙන වාසි අවම වීම.

    උදාහරණ:- ගුණාත්මක බවින් උසස් භාණ්ඩ නිෂ්පාදනය සම්බන්ධ ගැටලු

  - සංවර්ධනය වෙමින් පවතින රටවල නිෂ්පාදනයට විවිධ බහු ජාතික සමාගම් මඟින් ඇතිවන බලපෑම.

    උදාහරණ:- තේ වෙළෙඳපොළට විවිධ සිසිල් බීම වර්ගවල බලපෑම

  - දේශීය මුදල් විදේශවලට ඇදී යාම.

ගෝලීයකරණය ශ්‍රී ලංකාවට කරන බලපෑම

ධනාත්මක බලපෑම්

- ප්‍රාග්ධන ඌනතාවට පිළියම් ලෙස විදේශ ඍජු ආයෝජන යොදාගත හැකි වීම.
- ශ්‍රී ලංකා ආර්ථිකයේ ව්‍යුහමය බලපෑමක් ඇති කිරීම
  (කෘෂි අංශය අභිබවා කාර්මික අංශය වැදගත්වීම හා සේවා අංශයේ දායකත්වය වැඩි වශයෙන් කාර්මික අංශයට යොමු වීම)

- දේශීය නිෂ්පාදන ජාත්‍යන්තර වෙළෙඳපොළ සමග සම්බන්ධ වීම
  උදාහරණ:- ඇඟලුම්, මෘදුකාංග නිෂ්පාදනය
- යටිතල පහසුකම් පුළුල් වීම මත මූල්‍ය සංචලනය වේගවත් වීම
- ප්‍රාදේශීය සංවර්ධනය
- කලාපීය සංවිධාන සමග සම්බන්ධ වීම නිසා ලබන ආර්ථික, දේශපාලන වාසි.

ඍණාත්මක බලපෑම්

- දේශීය වෙළෙඳපොළ තුළ දේශීය නිෂ්පාදන අලෙවි කර ගැනීමේ දුෂ්කරතා මතු වීම
  උදාහරණ:- අත්යන්ත්‍ර රෙදිපිළි
- නොගැළපෙන පරිභෝජන රටාවකට ජනතාව යොමු වීම
  උදාහරණ:- ක්ෂණික ආහාර
- සංස්කෘතික දූෂණය
- ආර්ථිකයේ අභ්‍යන්තර ගැටලුවලට අනවශ්‍ය බලපෑම් කිරීම
  උදාහරණ:- සහනාධාර කපා හැරීම

**ගුණාත්මක යෙදවුම්**

ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා, අන්තර්ජාලයෙන් ලබාගත් අදාළ තොරතුරු.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

එක් එක් අවධිවල දී ශ්‍රී ලංකාවේ සිදු වූ සංවර්ධන යෝජනා ක්‍රම හා ඒවායින් ආර්ථිකයට සිදු වූ බලපෑම් පිළිබඳ ව සිසුන් සංවාදයකට යොමු කර සිසු ප්‍රතිචාර සැලකිල්ලට ගෙන ඒ ඔස්සේ ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

# 5.0 ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් නිරාකරණය

වර්තමාන සමාජය සංකීර්ණ වීමත් සමඟ පුද්ගලයා තුළ, පුද්ගලයින් අතර, සමාජ කණ්ඩායම් අතර මෙන් ම රටවල් අතර ද ගැටුම් නිර්මාණය වීම නිරන්තරයෙන් දක්නට ලැබේ. මෙලෙස ගැටුම් ඇති වීමේ ප්‍රතිඵලය වන්නේ මිල කළ නොහැකි තරම් විශාල ජීවිත හා දේපළ ප්‍රමාණයක් විනාශ වීමත්, ආබාධිත වූවන් හා අසරණභාවයට පත් වූ විශාල පිරිසක් සමාජයට එකතුවීමත් ය.

එබැවින් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ ගැටුම් ඇති වීමට බලපාන හේතු හඳුනා ගැනීම මෙන් ම සාමකාමී ව ගැටුම් නිරාකරණය කර ගැනීමේ නිපුණතාව සිසුන් තුළ වර්ධනය කිරීම සමාජ අවශ්‍යතාවක් බවට පත් ව ඇත. අන්මතවලට ගරු කිරීම, සාධාරණ විනිශ්චය, අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම, ඉවසීම වැනි ගුණාංග සාමකාමී ව ගැටුම් නිරාකරණය කර ගැනීම සඳහා සිසුන් තුළ වර්ධනය කළ යුතු අතර ම සාමය හා ආරක්ෂාව තහවුරු වීමත්, ජීවිත හා දේපළ හානි සිදු වීමෙන් වැළකීමත් ඉන් සිදු වේ. ඒ අනුව **ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් නිරාකරණය** කිරීම සඳහා අවශ්‍ය නිපුණතා සිසුන් තුළ වර්ධනය කිරීමට අවශ්‍ය ඉගෙනුම් අත්දැකීම් ලබා දීම මෙම පාඩම් ඒකකය අධ්‍යනය කිරීම තුළින් අපේක්ෂා කෙරේ.

**10.5 නිපුණතාව**

- ගැටුම් නිරාකරණය කර ගැනීමට අවශ්‍ය නිපුණතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම**

10.5.1 විවිධ වර්ගයේ ගැටුම් ඇති වීමට හේතු වන සාධක සොයා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාවः 05**

**ඉගෙනුම් පල**

- ගැටුම් යනු කුමක්දැයි හඳුන්වයි.
- ගැටුම් වර්ග නම් කරයි.
- ගැටුම් ඇති වීම සඳහා බලපාන හේතු පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- ගැටුම් නිර්වචනය කිරීම
  ගැටුම් වර්ග
    - i පුද්ගල අභ්‍යන්තර ගැටුම්
        - නොරිස්සුම
        - මත ගැටුම්
        - අවහිරතා ඇති වීම
        - පරමාර්ථ ඉටු නොවීම
    - ii සමාජ ආර්ථික ගැටුම්
    - i දේශපාලන ගැටුම්
- ගැටුම් ඇති වීමට බලපාන දේශපාලන මූල
    - දේශසීමා අරගල
    - බල ව්‍යාප්තිය
- ගැටුම් ඇති වීමට බලපාන ආර්ථික මූල
    - සම්පත් ලබා ගැනීම
    - වෙළෙඳපොළ ලබා ගැනීම
    - දිළිඳුකම
- සමාජමය මූල
    - මත ගැටීම්
    - වාර්ගික භේද
    - වර්ණභේද
    - ආගමික භේද

**ගුණාත්මක යෙදවුම්**

විවිධ ගැටුම් සම්බන්ධ පුවත්පත්, සඟරා ලිපි ශීර්ෂ

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පුද්ගල අභ්‍යන්තර ගැටුම්, සමාජ ආර්ථික ගැටුම් හා දේශපාලන ගැටුම් සම්බන්ධයෙන් සමාජයේ දැකිය හැකි තත්ත්වයන් විවිධ උදාහරණ සමග සාකච්ඡා කොට ඒ සඳහා සිසුන් දක්වන ප්‍රතිචාර පදනම් කර ගනිමින් සුදුසු නිර්ණායක පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

10.5.2 ගැටුම් නිරාකරණය සඳහා ධනාත්මක ප්‍රවේශ ගවේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාවː 07**

**ඉගෙනුම් පල**

- ගැටුම් නිරාකරණය කිරීම සඳහා විවිධ ක්‍රමවේද පැහැදිලි කරයි.
- ගැටුම් සාමකාමී ව නිරාකරණය කර ගැනීම පුරවැසියකු සතු යුතුකමක් බව පිළිගනිමින් කරුණු දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- ගැටුම් නිරාකරණය කිරිමේ විවිධ ක්‍රම
  - සාකච්ඡා කිරීම

    උදාහරණඃ-
    - සාකච්ඡා ක්‍රමය සාර්ථක වීමට නම්
      - අන්‍යෝන්‍ය සහයෝගය
      - අවබෝධයෙන් කටයුතු කිරීම
      - දෙපාර්ශවයේ කැප කිරීම ආදිය තිබිය යුතු ය.

  - සහමන්ත්‍රණ සහ කේවල් කිරීම
  - මැදිහත්කරණය

    මැදිහත්කරුවෙකු සතු විය යුතු ගුණාංග

    උදාහරණඃ-
    - දෙපාර්ශ්වයට ම පිළිගත හැකි කෙනෙකු වීම
    - ගැටුම පිළිබඳ හොඳ අවබෝධයක් තිබීම
    - ගැටුම විසඳා ගැනීමට සහාය වීම
    - තමාගේ තීන්දුව අනුන් මත නොපවරා සිටීම
    - දෙපාර්ශ්වයට ම බලපෑම් නොකරන්නෙකු වීම
  - සමථකරණය

    සමථකරුගේ කාර්යය පහත පරිදි වේ.

    උදාහරණඃ
    - ප්‍රතිවිරුද්ධ පක්ෂයන් අතර සංවාදයක් ඇති කිරීම
    - ගැටුමට තුඩු දී ඇති හේතු පිළිබඳ විග්‍රහ කිරීමට මුල පිරීම
    - ගැටුමට තුඩු දී ඇති කරුණු පිළිබඳ ව ඍජු හෝ වක්‍ර වශයෙන් සාකච්ඡා ඇති කිරීම
    - ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයන් අතර වෙනස්කම් සහ පරතරයන් අඩු කිරීමට ක්‍රියා කිරීම
    - සම්මුතියට එළඹීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් යෝජනා කිරීම.
  - සමථකරුවෙකු සතු විය යුතු ගුණාංග

    උදාහරණඃ
    - ඉවසිලිමත් ව ඇහුම්කන් දෙන්නෙකු වීම
    - විශ්වාසවන්ත අයකු වීම

- සමථකරණයට ඇපකැප වූවකු වීම
- බේරුම්කරුවෙකු සතු විය යුතු ගුණාංග

උදාහරණ:-

    - ස්වේච්ඡාවෙන් වැඩ කරන්නෙකු වීම
    - පෞද්ගලිකත්වය ආරක්ෂා කරන්නෙකු වීම
    - ඉක්මනින් විසඳුම් දෙන්නෙකු වීම
    - ලාභ අපේක්ෂාවෙන් තොර අයකු වීම
    - අපක්ෂපාතී අයකු වීම
    - ගැටුම් පිළිබඳ හොඳ අවබෝධයක් ඇති අයකු වීම

- විනිසීම
- ඒකඟතාවක් ගොඩනැඟීම
- උපදේශනය

**ගුණාත්මක යෙදවුම්**

ගැටුම් නිරාකරණය පිළිබඳ දැක්වෙන රූප රාමු, ලිපි ශීර්ෂ

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ගැටුම් අවස්ථා සම්බන්ධ ව විවිධ සිද්ධීන් කිහිපයක් විසඳීම සඳහා සිසුන් කණ්ඩායම්වලට යොමු කර ඒ ඔස්සේ සිසුන් ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

10.5.3 ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් නිරාකරණය කිරීමේ වැදගත්කම විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාවඃ** 03

**ඉගෙනුම් පල**

- සාමකාමී ව ගැටුම් නිරාකරණය කර ගැනීමට පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග සාකච්ඡා කරයි.
- ගැටුම් මඟ හැරීම හා සාමකාමී ව විසඳා ගැනීමෙන් තම ජීවිතයට සිදු වන යහපත අගය කරමින් අදහස් ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- ගැටුම් සාමකාමී ව නිරාකරණය කර ගැනීම සඳහා පුරවැසියෙකු තුළ තිබිය යුතු ගුණාංග
  උදාහරණඃ
  - අන්‍යමත ගරු කිරීම
  - අයිතිවාසිකම් භුක්ති විඳිමින් තම යුතුකම් ඉටු කිරීම
  - තීරණ ගැනීමේ හැකියාව
  - ප්‍රශ්න විසඳීමේ හැකියාව
  - සාධාරණ විනිශ්චය
  - නිර්මාණාත්මක ව සිතීමේ හැකියාව
  - ජය - පරාජය සමාන ලෙස විඳදරා ගැනීම
  - අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම
  - පරිත්‍යාගශීලී බව
  - අවිහිංසාවාදී බව
  - ඉවසීම
  - සඵලවත් සන්නිවේදනය
  - කාරුණික බව
  - අන්තර් පුද්ගල සබඳතා
  - හැඟීම්වලට මුහුණ දීමේ හැකියාව
  - සෑම පුද්ගලයෙකුට ම ගරු කිරීම
  - සක්‍රිය සවන්දෙන්නෙකු වීම
  - යහපත් වචන භාවිතය

- ගැටුම් සාමකාමී ව විසඳා ගැනීමේ වාසි
  උදාහරණඃ-
  - සාමය හා ආරක්ෂාව සුරක්ෂිත වීම
  - ජීවිත හානි වැළකීම
  - දේපළ හානි වැළකීම
  - සම්පත් නාස්ති නොවීම
  - පුද්ගල මානසිකත්වය බිඳ වැටීම වැළකීම
  - මානසික ආතතිය අවම වීම
  - පුද්ගල ආත්ම ගෞරවය සුරැකීම
  - සමාජයට සිදු වන හානි අවම වීම

- අන්‍යෝන්‍ය සහයෝගය වර්ධනය වීම
- සාමකාමී සමාජ ක්‍රමයක් ගොඩ නැගීම

**ගුණාත්මක යෙදවුම්**
සාමකාමී සහජීවනය පිළිබඳ ලියන ලද වාර්තා, ලිපි

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**
සාමකාමී ව ගැටුම් විසඳා ගැනීමේ වාසි සහ ඒ සඳහා පුරවැසියකු ප්‍රගුණ කළ යුතු ගුණාංග පිළිබඳ ව වාක්‍ය රචනයක් ලිවීමට සිසුන් යොමුකර ඒ ඔස්සේ සිසුන් ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**විවිධ සහය**

| | |
|---|---|
| ඒ.එල්.එස්.පී. අතපත්තු | කළමනාකරණ සහකාර<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| සිමිස්කා සුසිකෝ ජයවර්ධන | කළමනාකරණ සහකාර<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |

**පිටකවර නිර්මාණය**

| | |
|---|---|
| රවීන්ද්‍ර තේනුවර | කථිකාචාර්ය<br>සෞන්දර්ය දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |